

# ගෞරවය, සමානාත්මතාවය සහ පාලනය

## ශ්‍රී ලංකාවේ LGBTIQ+ ප්‍රජාවේ අයිතිවාසිකම් අවබෝධ කර ගැනීම සහ සහාය දීම සඳහා මාර්ගෝපදේශයක්


සම්පාදනය

**H.K.M තුෂාර මනෝජ්**
**N.B ආදිල් සුරාජ් විමුක්ති**



Equité ආයතනයේ ප්‍රකාශනයකි

# ගෞරවය, සමානාත්මතාවය සහ පාලනය

ශ්‍රී ලංකාවේ LGBTIQ+ ප්‍රජාවේ අයිතිවාසිකම් අවබෝධ
කර ගැනීම සහ සහාය දීම සඳහා මාර්ගෝපදේශයක්

සම්පාදනය
H.K.M.තුෂාර මනෝජ්
N.B. ආදිල් සුරාජ් විමුක්ති

ISBN 978-624-4888-00-0

පිටකවර නිර්මාණය - N.B. ආදිල් සුරාජ් විමුක්ති

Equité ආයතනයේ ප්‍රකාශනයකි
2026 පෙබරවාරි.

# පටුන

හැඳින්වීම ..........................................................................................3

01. LGBTIQ+ ප්‍රජාව කියන්නෙ කවුද?...................................................... 6

02. LGBTIQ+ ප්‍රජාව පිළිබඳ ඓතිහාසික හා සංස්කෘතික සන්දර්භය. ............36

03. LGBTIQ+ ප්‍රජාවේ ජීවන යථාර්ථය. ....................................................41

04. ශ්‍රී ලංකාවේ ජීවත් වන LGBTIQ+ ප්‍රජාව මුහුණ දෙන පොදු අභියෝග 43

05. LGBTIQ+ ප්‍රජාව ගැන තිබෙන පොදු මිත්‍යාවන් ගැන ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය පැහැදිලි කරලා තියෙන්නෙ කොහොමද?47

06. පොලිස් නිලධාරීන් ඇතුළු සේවා සපයන පාර්ශ්වකරුවන්ගෙන් LGBTIQ+ ප්‍රජාව මොනවද බලාපොරොත්තු වෙන්නෙ?......................53

07. LGBTIQ+ ප්‍රජාවට සහයෝගය දක්වන සහ විවිධත්වය අගය කරන ආයතන මොනවාද?..................................................................58

08. LGBTIQ+ ප්‍රජාවේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීමට දැනට පවතින නඩු තීන්දු ගැසට්, ප්‍රකාශන, නිර්දේශ සහ හෝ මාර්ගෝපදේශ මොනවාද? ..........................................................61

09. රාජ්‍ය සේවයේ වගවීම සහ ජාත්‍යන්තර එකඟතාවයන්..................... 77

10. ජාත්‍යන්තර සම්මුතීන් සහ ගිවිසුම්.................................................... 80

හැඳින්වීම

LGBTIQ+ ප්‍රජාව ඇතුළු ආන්තිකරණයට ලක් වූ ප්‍රජාවන්ට සේවය සපයන පාර්ශවකරුවෙකු වන ඔබ, එම ප්‍රජාව සමග කටයුතු කිරීමේදී නිවැරදි ආකල්ප සහිතව, ආචාර ධර්ම ආරක්ෂා කරමින් මෙන්ම විනිවිදභාවයෙන් යුතුව සේවය සැපයීම අත්‍යාවශ්‍ය වේ.

මෙම පොත් පිංච මගින් ඔබට, LGBTIQ+ ප්‍රජාව යනු කවුරුන්ද, ඔවුන්ට තිබෙන ගැටළු මොනවාද, ඔවුන් සමාජය තුළ ජීවත්වීමේදී මුහුණ දිය හැකි අභියෝග සම්බන්ධයෙන් මෙන්ම නිලධාරියෙකු වශයෙන් ඔබට, ඔවුන්ට පහසු පාර්ශවකරුවෙකු විය හැකි ආකාරය පිළිබඳව මාර්ගෝපදේශයක් සපයයි.

මෙම මාර්ගෝපදේශය සකස් කිරීම හරහා අප බලාපොරොත්තු වන්නේ LGBTIQ+ ප්‍රජාව වැනි ආන්තිකරණයට ලක් වූ සහ, කොන්කොට සැලකීම සහ වෙනස්කොට සැලකීම් වලට මුහුණ දෙන ප්‍රජාවගේ ගරුත්වය, විවිධත්වය සහ මානව හිමිකම් ආරක්ෂා කරන සහ ප්‍රවර්ධනය කිරීම සිදුකරන නිලධාරියෙකු ලෙස ඔබ පුහුණු කිරීමයි. LGBTIQ+ ප්‍රජාවේ විවිධත්වය, ආත්ම ගරුත්වය සහ යහපත් රාජ්‍ය සේවයක් මැයෙන් ඉක්විටි ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන පුහුණු වැඩසටහන්වලට සහභාගී වන ඔබට මෙම පොත් පිංච ඉදිරිපත් කරන්නේ මහත් ගෞරවයෙන් සහ සහයෝගීතාවයෙන්.

LGBTIQ+ පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා කැප වූ ජාතික සංවිධානයක් වන Equite ආයතනය සමාජ

සාධාරණත්වය සහ ආචාර ධර්ම ප්‍රවර්ධනය කරමින් සහ විනිවිදභාවයෙන් යුතුව සිදුකරන රාජ්‍ය සේවයක් වෙනුවෙන් ඔබගේ කැපවීම අගය කරන අතර, මෙම පුහුණු වැඩසටහන මගින් ඔබගේ දැනුම සහ ආකල්ප සංවර්ධනය වනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

අපේ රට පුරා ජීවත්වෙන බොහෝ LGBTIQ+ පුද්ගලයින් තවමත් අපකීර්තිය, වරදවා වටහා ගැනීම හෝ වෙනස්කම් වලට ලක්වීමේ අතීත අත්දැකීම් හේතුවෙන් බියෙන් හා නිශ්ශබ්දතාවයෙන් ජීවත් වෙති. විශේෂයෙන් LGBTIQ+ ප්‍රජාව සමාජ බැහැර කිරීම්වලට මුහුණ දීමේ සිට ඉතාම දරුණු ආකාරයේ ප්‍රචණ්ඩත්වය අත්විදිම දක්වා අද්විතීය හා බොහෝ විට නොපෙනෙන අභියෝගවලට මුහුණ දෙයි. ඒවා රාජ්‍ය ආයතන, විශේෂයෙන් පොලිසිය ඔවුන් කෙරෙහි සහකම්පනයෙන්, අඛණ්ඩතාවයෙන් සහ සාධාරණත්වයෙන් ක්‍රියා කළ විට පමණක් විසඳා ගත හැකිය. සියලුම ශ්‍රී ලාංකිකයන්ගේ ගෞරවය සහ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ඔබ දක්වන කැපවීමට සහාය වීම සඳහා මෙම පොත් පිංච නිර්මාණය කර ඇත. එමගින්, පුද්ගලයින්ගේ ලිංගික දිශානතිය, සමාජභාවීය අනන්‍යතාවය, ස්ත්‍රී පුරුෂ භාවය ප්‍රකාශ කිරීම හෝ ලිංගික ලක්ෂණ නොසලකා ඔවුන්ට ප්‍රායෝගික මඟ පෙන්වීම, දේශීය සන්දර්භය සහ යුක්තිය සහ සමානාත්මතාවය ලුහුබැඳීමේදී කිසිවෙකු අතහැර නොයන බව සහතික කිරීමට උපකාරී වන ප්‍රයෝජනවත් මෙවලම් සපයයි.

Equite හි අපි විශ්වාස කරන්නේ ආරක්ෂිත සමාජයක් යනු වෙනස්කම් වලට දඬුවම් නොදෙන, නමුත් වෙනස්කම් වලට ලක්වන පුද්ගලයින්

ආරක්ෂා කරන සමාජයක් බවයි. නීතිය ක්‍රියාත්මක කරන සහ මහජනතාව වෙනුවෙන් සේවය සපයන වෘත්තිකයන් ලෙස ඔබේ කාර්යභාරය මෙම ගමනේදී ඉතා වැදගත් වේ. එක්ව, සෑම පුරවැසියෙකුටම ඔවුන් කවුරුන් වුවත් විශ්වාසයෙන් යුතුව ඔබගේ සේවා ස්ථානයට ඇතුළු විය හැකි, ගෞරවයෙන් සලකනු ලැබිය හැකි සහ යුක්තියෙන් ආරක්ෂාව ලැබිය හැකි අනාගතයක් ගොඩනගමු.

ඔබගේ සේවය, ඔබේ නායකත්වය සහ ඉගෙනීමට ඇති ඔබේ විවෘතභාවයට ස්තූතියි.

# 01. LGBTIQ+ ප්‍රජාව කියන්නෙ කවුද?

LGBTIQ+ ප්‍රජාව කියන්නෙ ශ්‍රී ලංකාව ඇතුළුව මුලු ලෝකයේම ඉන්න ආන්තිකරණයට ලක් වූ ප්‍රජාවක්. ඔවුන් පිළිබඳ මිනිසුන් තුළ පවතින නොදැනුවත්භාවය, වෛරය,ගතානුගතික ආකල්ප හා වැරදි තොරතුරු මත පදනම්ව ඔවුන්ව විවිධාකාරයෙන් වෙනස්කොට සැලකීමට ලක් කරනවා. කොන් කරනවා.අපහාස කරනවා විතරක් නෙමෙයි ඔවුන්ට එරෙහිව ශාරීරික, වාචික වගේම මානසික හිංසන ද සිදු වෙනවා. හැබැයි ඔවුන්ට හිරිහැර කරන බොහෝ දෙනෙක් අමතක කරන දෙයක් තමයි අනිත් මිනිසුන්ට වගේම ඔවුන්ටත් මූලික අයිතිවාසිකම් භුක්ති විදීමට අයිතිවාසිකම් තිබෙන බව, අනෙකුත් මිනිසුන් හා සමානව ජීවත් වීමේ අයිතිය තිබෙන පුද්ගලයින් බව සහ මානව හිමිකම් භුක්ති විදීමට ඔවුන්ටත් අයිතියක් තියෙන බව. ඒ වගේම ඔවුන්ගේ ලිංගිකත්වය හෝ ලිංගික අනන්‍යතාවය කුමක් වුවත් ඔවුන් ද මිනිසුන් බව.

LGBTIQ+ ප්‍රජාවට වෙනස්කොට සලකන හෝ හිරිහැර කරන විවිධ කණ්ඩායම් අතරින් ශ්‍රී ලංකා පොලිසිය ප්‍රමුඛ ස්ථානයක් ගන්නවා. Equite ආයතනය 2023 වර්ෂයේ දී සිදු කළ පර්යේෂණ වලට අනුව LGBTIQ+ ප්‍රජාවේ බොහෝ දෙනෙකුට පොලිසිය සම්බන්ධයෙන් පවතින්නේ එතරම් යහපත් ආකල්පයක් නොවේ. අනීතික අත්අඩංගුවට ගැනීම, පහරදීම, අමානුෂික වධහිංසාවලට ලක් කිරීම, අපහාස කිරීම, සමරිසි හෝ සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන්ව ඔවුන්ගේ දෙමාපියන්ට හෝ සමාජයට බලහත්කාරයෙන් විවෘත කරවීම, අනෙක් අය ඉදිරියේ පරුෂ වචනයෙන් බැන වැදීම, පිළිකුල් කිරීම යනාදී විවිධ

ආකාරයෙන් ඔවුන්ට එරෙහිව පොලිසියෙන් සිදුවන හිංසන සම්බන්ධයෙන් තොරතුරු නිරන්තරයෙන් වාර්තා වෙනවා.

එවැනි හිංසන සහ වෙනස්කොට සැලකීම් සම්බන්ධයෙන් LGBTIQ+ ප්‍රජාව දේශිය හා ජාත්‍යන්තර මානව හිමිකම් යාන්ත්‍රණවලට පැමිණිලි කරනු ලබන අතර එම පැමිණිලි මත පදනම්ව සිදු කරනු ලැබූ විමර්ශන සහ මැදිහත්වීම් නිසා ශ්‍රී ලංකා පොලිසිය LGBTIQ+ ප්‍රජාවේ මානව හිමිකම් ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට දැන් දායක වෙමින් සිටී. ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් පුහුණු වෙමින් සිටී.

දැන් අපි සරලවම LGBTIQ+ ප්‍රජාව කියන්නෙ කවුරුන්ද කියලා හඳුනා ගනිමු.

- L – Lesbian - ලෙස්බියන් - සමරිසි කාන්තාවන්
- G – Gay - ගේ - සමරිසි පුරුෂයන්
- B – Bisexual - බයිසෙක්ෂුවල්- ද්විරිසි කාන්තාවන් හා පුරුෂයන්
- T -Transgender - ට්‍රාන්ස්ජෙන්ඩර්- සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින්
- I – Intersex - ඉන්ටර්සෙක්ස් - අන්තර් ලිංගික පුද්ගලයන්
- Q - Questioning - ප්‍රශ්නභාවී - තමන්ගේ ලිංගික දිශානිය හෝ සමාජභාවීය අනන්‍යතාවය කුමක්දැයි තවමත් හඳුනා ගනිමින් සිටින පුද්ගලයින්

- + - ඉහතින් කියපු අයට අමතරව තවත් ලිංගික දිශානතීන් සහ සමාජභාවීය අනන්‍යතාවන් තිබෙනවා. ඔවුන් සියලුම දෙනා නියෝජනය කරන්න තමයි මේ + සලකුණ යොදන්න

**Lesbian - ලෙස්බියන් - සමරිසි කාන්තාවන්**

සමරිසි කාන්තාවන් කියන්නෙ කිසියම් කාන්තාවක් තවත් කාන්තාවකට කායිකව ඒ කියන්නෙ ලිංගිකව, මානසිකව ඒ කියන්නෙ එයා ආදරය කරන්න කැමති සහ අධ්‍යාත්මිකව ඒ කියන්නෙ එයා ජීවත් වෙන්න කැමති තවත් කාන්තාවකට වීමේ තත්ත්වයයි. මෙලෙස කායික,මානසික, සහ ආධ්‍යාත්මිකව කාන්තාවක් තවත් කාන්තාවකට ආකර්ෂණය වීමට තමයි සමරිසි කාන්තාවක් කියලා නිර්වචනය කරන්නේ අන්තර්ජාතික මනෝ විද්‍යාඥවරුන්ගේ සංගමයයි.

ලෝකය විවිධයි. හැමදෙනාම එක විදිහට ඉපදෙන්නෙ නැහැ. ඉපදෙන හැමකෙනාම විරුද්ධ ලිංගිකයින්ට ආකර්ෂණය වෙන්නේ නැහැ. කාන්තාවක් වෙලා ඉපදිලා තවත් කාන්තාවකට ආකර්ෂණය වෙන අයත් ඉන්නවා. ඒක එයා ඉපදෙනකොට එයාට ලැබුණු ජාන, හෝමෝන සහ මනෝවිද්‍යාත්මක සාධක මත පදනම් වුණ දෙයක්. එයා සමරිසි කාන්තාවක් වෙලා තියෙන්නෙ එයාගෙ කැමැත්තෙන් නෙමෙයි. ඔබ ඇතුළු සමාජය එයාලට අපහාස කරන තරමට, කවුරුත් කැමැත්තෙන් අපහාස අහගන්න, විඳගන්න බලාගෙන සමරිසි වෙන්නෙ නෑ කියලා ඔබ මතක තබාගන්න ඕන. ඒ වගේම මනෝ විද්‍යාත්මක ප්‍රතිකර්මවලින් හෝ වෙනත් වෛද්‍ය විද්‍යාත්මක ප්‍රතිකාරවලින්,

තොවිල් වගේ ශාන්ති කර්ම වලින් එයාලට, ඒ දැනෙන විදිහ වෙනස් කරන්න බැහැ.

## Gay - ගේ - සමරිසි පුරුෂයන්

සමරිසි පුරුෂයන් කියන්නෙ පුරුෂයෙක් තවත් පුරුෂයෙක් කෙරෙහි කායිකව, මානසිකව සහ ආධ්‍යාත්මිකව ආකර්ෂණය වීමයි. ඉහතින් සඳහන් කරා වගේම තමයි සමරිසි පුරුෂයනුත්.ඔවුන්ගේ ජාන, හෝර්මෝන සහ මනෝ විද්‍යාත්මක සාධක මත පදනම්ව ආකර්ෂණය වෙන්නේ තවත් පුරුෂයෙක්ට. අන්තර්ජාතික මනෝ විද්‍යාඥවරුන්ගේ සංගමය පැහැදිලි කරලා තියෙන ආකාරයට සමරිසි වීම කියන්නෙ අතිශය සාමාන්‍ය දෙයක්. සමරිසි වීම පාලනය කරන්න බැහැ. මොකද ඒ පුද්ගලයන්ගේ හැඟීම් නිසා.

ශ්‍රී ලංකාවේ සමරිසි පුරුෂයන් ලක්ෂ ගානක් ජීවත් වෙනවා.ඒත් ඔවුන්ට සමාජයෙන් සිදුවන වෙනස්කොට සැලකීම් සහ කොන් කිරීම නිසා බොහෝ දෙනා තමන්ගේ අනන්‍යතාවය සඟවාගෙන තමයි ජීවත් වෙන්නෙ.

## Bisexual - බයිසෙක්ෂුවල් - ද්විරිසි  කාන්තාවන් හා පුරුෂයන්

බයිසෙක්ෂුවල් කියන්නෙ කිසියම් පුද්ගලයෙක් කාන්තාවන්ට හා පුරුෂයන්ට යන දෙපාර්ශවයම ආකර්ෂණය වීමයි. බයිසෙක්ෂුවල් අයට ලිංගිකව, මානසිකව හෝ ආධ්‍යාත්මිකව කාන්තාවන් හා පුරුෂයන් යන දෙපාර්ශවයම දැනෙනවා. ඔවුන් ජීවිතයේ තමන්ට වඩාත්ම පහසු සහ

දැනෙන පුද්ගලයා සමඟ ජීවත් වීමට හෝ ආදරය කිරීමට තෝරා ගන්නවා. ඉතින් කිව්වා වගේම මේකත් ලෙඩක් හෝ අසාමාන්‍ය තත්ත්වයක් නෙමෙයි.

මිනිස්සු විවිධයිනේ. ඉතින් බයිසෙක්ෂුවල් අය ඉපදෙන්නෙ එයාල ගැහැණු සහ පිරිමි යන දෙගොල්ලන්ටම ආකර්ෂණය වන විදිහට.එම සම්බන්ධතාවල ස්වභාවය නිසා ඔවුන්ට සමහරවිට ඔබගේ උපකාරය, උපදෙස්, සහ සහයෝගය අවශ්‍ය වෙන්න පුළුවන්. ඔවුන්ට ඔබගේ සහාය ලබාදෙන්න නම් ඔබට පුළුවන් වෙන්න ඕනි ඔවුන් දිහා විවෘත මනසින් සහ ඔවුන්ගේ ගැටළු මධ්‍යස්ථ ආකාරයෙන් තේරුම් ගන්න.

## Transgender - ට්‍රාන්ස්ජෙන්ඩර් - සංක්‍රාන්ති සමාජභාවය

සංක්‍රාන්තියක් කියන්නෙ එක ගනනින් තවත් ගණනාවකට යන එක කියලා ඔයාල හැමෝම දන්නවනේ.මේ කියන ආකාරය නම් ඒ එසේ සරල දෙයක් නෙමෙයි. මේක පුද්ගලයින්ගේ අනන්‍යතාව සම්බන්ධ තත්ත්වයක්. හිතන්නකො කිසියම් පුද්ගලයෙක් පුරුෂලිංග අවයව සහිතව ඉපදුනා කියලා.එයාට උපතින් පවරා දෙනවා එයා පුරුෂයෙක් කියලා.එයාගෙ බාහිර ලිංගික අවයව දිහා බලලනේ මෙහෙම එයාගෙ ලිංගභාවය තීරණය කරන්නෙ.උපතින් පුරුෂයෙක් ලෙස ලිංගික අවයව ලැබිල උප්පැන්න සහතිකයේ පුරුෂ ලෙස නම් කල කෙනෙකුට මානසිකව දැනෙන්න පුළුවන් තමන් කාන්තාවක් කියලා.එහෙමත් නැත්නම් උපතින් ස්ත්‍රී ලිංග අවයවයක් ලැබුන උප්පැන්න සහතිකයේ

ස්ත්‍රී ලිංගභාවය ලැබුන කෙනෙකුට මනසින් දැනෙන්න පුළුවන් එයා පුරුෂයෙක් කියලා.

මෙන්න මේ විදිහට උපතින් ලැබුණු ලිංගභාවයට විරුද්ධ ආකාරයෙන් මනෝභාවයක් ලැබෙන, එහෙමත් නැත්නම් උපතින් ලැබුණු ලිංගභාවය අනුව නෙමෙයි විරුද්ධ ලිංගික කෙනෙකු එසේ හිතෙන අදින පළඳින කතා බහ කරන, හැසිරෙන පුද්ගලයින්ට තමයි සංක්‍රාන්තික සමාජභාවය කියන්නෙ.

මෙයාල කොටස් දෙකක් ඉන්නවා

1) **සංක්‍රාන්තික සමාජභාවීය පුරුෂයන් -** උපතින් ස්ත්‍රී ලිංග අවයව සහිතව ඒකියන්නේ උප්පැන්න සහතිකයේ ලියාපදිංචි කරපු එහෝ දැනුම් තේරුම් ඇති වයසට එනකොට තමන් පුරුෂයෙක් ලෙස දැනෙන පුද්ගලයන්.
2) **සංක්‍රාන්තික සමාජභාවීය ස්ත්‍රී -** උපතින් පුරුෂ ලිංගික අවයව සහිතව පුරුෂයෙක් ලෙස උප්පැන්න සහතිකයේ ලියාපදිංචි එහෝ තමන්ගේ මනසින් තමන්ට කාන්තාවක් ලෙස දැනෙන සහ තමන් කාන්තාවක් ලෙස දැනෙන පුද්ගලයන්.

සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයන් ලක්ෂ ගණන් අප අතර ජීවත් වෙනවා.බොහෝ අය සමාජයෙන් එන පීඩනය නොසලකා හැරීම, කොන් කොට සැලකීම නිසා තමන්ගේ අනන්‍යතාව සඟවාගෙන ජීවත්වෙනවා.තවත් අය තමන්ගේ සැබෑ අනන්‍යතාවය ප්‍රකාශ කරමින් තමන්ට දැනෙන ආකාරයට ජීවත් වෙන්න පටන් ගන්නවා. එහෙම තමන්ගේ සැබෑ අනන්‍යතාවයෙන් ජීවත් වෙන එක කිසිසේත්ම පහසු

දෙයක් නම් නෙමෙයි. මොකද සමාජයෙන් විශාල අපකීර්තියක් අපහාසයක් ඔවුන්ට සිදු වෙනවා. ඒ සියලු දේවල් දරාගෙන තමයි ඔවුන් සමාජය තුළ "තමන් තමන් විදිහට ජීවත් වෙන්නේ" හැබැයි ඔබ ඔවුන් ගැන නිවැරදි දැනුවත්භාවයක් තිබුනොත් ඔවුන්ට සහයෝගය දක්වන්න ඔබට පුළුවන් වේවී.

## <u>Intersex - ඉන්ටර්සෙක්ස් - අන්තර් ලිංගික පුද්ගලයන්</u>

සියලුම පුද්ගලයින් උපතින්ම විවිධාකාර බව මේ වන විට ඔබ පැහැදිලිව දන්නා කරුණකි. අන්තර් ලිංගික පුද්ගලයන් යනු පුද්ගලයන් උපතේදී ඔවුන්ට අසාමාන්‍ය ලිංගික අවයව සහිතව උපත ලැබීමයි.කිසියම් පුද්ගලයෙකුගේ ජීව විද්‍යාත්මක ලිංගභාවය තීරණය වන්නේ ඔහු හෝ ඇයට පිහිටා ඇති ලිංගික අවයවවල ස්වභාවය මතය.

පුරුෂ හෝ ස්ත්‍රී ලිංගික අවයව ලෙස සාම්ප්‍රදායිකව හඳුනාගන්න ශිෂ්කය සහ වෘෂණ හා /හෝ යෝනියක් පිහිටන ආකාරය අසාමාන්‍ය ජීව අන්තර්ලිංගික තත්ත්වයයි.බොහෝ අවස්ථා වලදී යෝනියක් සහ ශිෂ්ණයක් යන දෙකම සහිතව ඉපදීම හඳුනාගත හැකිය.

- ලෝකයේ ජනගහනයෙන් 1.7%ක් පමණ අන්තර් ලිංගික වේ.
- ඔවුන් රෝගීන් නොවේ.
- බොහෝ අයගේ අන්තර්ලිංගික තත්ත්වය උපතින් හඳුනාගත හැකි අතර සමහර අයගේ ලිංගික අවයව තරුණ වියට පැමිණියාට පසු වර්ධනය නොවන තත්වයන්ද හඳුනාගත හැකිය.

- තවත් සමහරුන්ගේ මඳසරුභාවය හෝ ජාන පරීක්ෂා කිරීමකදී ඔවුන් අන්තර්ලිංගික බව හඳුනාගෙන ඇත.

පොලිස් නිලධාරීන් හෝ වෙනත් සේවා ලබාදෙන පුද්ගලයින් වශයෙන් බව අන්තර්ලිංගික ප්‍රජාව පිළිබඳ දැන සිටීම ඉතාම වැදගත්. ඔවුන්ට නීතිමය නොගැනීම, ලිංගික හා ප්‍රජනන අයිතිවාසිකම් උල්ලංඝනය වීම, බලහත්කාරයෙන් හෝ අනුමැතිය ලබා නොගෙන සිදුකරන ශල්‍යකර්ම, සමාජ අවහිරතා, ලැජ්ජාව,අවමානය හා අපහාස යනාදී විවිධ ගැටළුවලට ඔවුන් මුහුණ දෙයි.

**<u>Questioning - ප්‍රශ්නභාවී - ලිංගික දිශානිය හෝ සමාජභාවය තවමත් හඳුනා ගනිමින් සිටින අය.</u>**

ශ්‍රී ලංකාව වැනි රටවල් වල පරිපූර්ණ ලිංගික අධ්‍යාපනය නොමැති වීම හෝ ලිංගිකත්වය පිළිබඳ දැනීම සහ තොරතුරු ලබාගැනීමට හැකි ප්‍රවේශය අවහිර වීම යන හේතු මත සමහර පුද්ගලයන් සැබෑ ලෙසට තමන්ගේ අනන්‍යතාව කුමක් දැයි තේරුම් ගැනීමට හා හඳුනාගැනීමට නොහැකිව විවිධාකාරයෙ අපහසුතාවලට මුහුණ දෙමින් සිටී. තවත් අය තමන්ගේ අවශ්‍යතාවය සොයමින් සහ ප්‍රශ්න කරමින් ඔවුන්ගේ ජීවිතයේ වටිනා කාලය නාස්ති කරගන්නවා දැකිය හැකිය.

Questioning යනුවෙන් හැඳින්වෙන්නේ තමන්ගේ ලිංගික අනන්‍යතාව (තමන් කැමති කාටද?) සමාජභාවීය අනන්‍යතාව (තමන්ගේ සැබෑ පුද්ගල අනන්‍යතාව) හෝ ලිංගික ප්‍රකාශනය (තමන් පෙනී සිටින ආකාරය) පිළිබඳ තවමත් ස්ථිර තීරණයකට නොපැමිණීමයි. මෙය

සමහරුන්ට තමන්ගේ මුලු ජීවිත කාලය පුරාම ගවේශනය කරමින් සිටීමට සිදුවන තත්ත්වයක් විය හැකිය.

- සමහරුන්ට තමන් ලිංගිකව කැමති කාටද යනුවෙන් අභියෝග පැවතිය හැකිය.
- සමහරුන්ට තමන්ගේ සමාජභාවීය අනන්‍යතාව ගැන ප්‍රශ්න තිබිය හැකිය.
- තවත් සමහරුන්ට තමන් අඳින පළඳින කැමති ආකාරය හෝ සමාජයේ නොසිටින ආකාරය ගැන ප්‍රශ්න තිබිය හැකිය.

## Sexual Orientation- ලිංගික දිශානතිය

මේ වෙනකොට ඔබ දන්නවා කවුද LGBTIQ+ ප්‍රජාව කියලා. ඉහතින් දක්වපු ආකාරයට අමතරව තවත් අනන්‍ය විශාල ප්‍රමාණයක් තියෙනවා. ඒ ගැන ඔයාලට දැනගන්න පුළුවන් මේ අත්පොතේ මුලින්ම දමා ඇති පාරිභාෂික වචන මාලාවෙන්.

ලිංගික දිශානතිය කියන්නෙ කිසියම් පුද්ගලයෙකු කායිකව, මානසිකව, සහ ආධ්‍යාත්මිකව ආකර්ෂණය වෙන්නේ කාටද කියන එක. එහෙමත් නැත්නම් කිසියම් පුද්ගලයෙක් ලිංගිකව එකතු වෙන්න කැමති ආදරය කරන්න කැමති සහ එකට ජීවතේ බෙදාගන්න කැමති කවුරුත් සමඟද කියන එක.ලිංගික දිශානතිය කියන්නෙ තෝරාගැනීමක් නෙමෙයි. එම පුද්ගලයන්ට තමන් පිළිබඳ සහ තමන්ගේ අධ්‍යාත්මය ගැන දැනෙන ගැඹුරු සහ සංවේදී හැඟීම් දාමයක එකතුවක්. අපිට තවත් කෙනෙකුගේ

ලිංගික දිශානතිය හොයල දෙන්න බැහැ. ඒ වගේම ඔයා මේ අයට කැමති වෙන්න මේ අය එපා කියන්න අපිට අයිතියක් නැහැ.

ලිංගික දිශානතින් ප්‍රධාන කොටස් 05කි.

I. විෂමරිසිභාවය - Heterosexual
II. සමරිසිභාවය- Homosexual
III. ද්විරිසිභාවය- Bisexual
IV. නිර්රිසිභාවය- Asexual
V. බහුරිසිභාවය- Pansexual

## I. විෂමරිසිභාවය - Heterosexual

තමන්ම ප්‍රතිවිරුද්ධ ලිංගියේ පුද්ගලයන්ට කායිකව,මානසිකව සහ ආධ්‍යාත්මිකව ආකර්ෂණය වන පුද්ගලයන්ට තමයි විෂමරිසි අය කියන්නෙ. කාන්තාවන් පුරුෂයෙකුටත්, පුරුෂයෙක් කාන්තාවකටත් ආකර්ෂණය වීම. එකිනෙකා සමඟ ආදරය කිරීමට සහ ජීවිතය බෙදාගන්න කැමති වීම. මේ අයට ස්ට්‍රේට් (straight) කියලත් කියනවා.

## II. සමරිසිභාවය- Homosexual

තමන්ට සමාන ලිංගයේ පුද්ගලයන්ට කායිකව,මානසිකව සහ ආධ්‍යාත්මිකව ආකර්ෂණය වීම තමයි සමරිසිභාවය කියන්නෙ. සමරිසි පුරුෂයන් (Gay) සහ සමරිසි ස්ත්‍රීන් (Lesbian) කියලා කොටස් දෙකක් තිබෙනවා. දැන් සමලිංගික කියන වචනය භාවිතා කරන්නේ නැහැ.

මොකද සමලිංගික කියන වචනය සමඟ සමාජය ද එම පුද්ගලයන් සම්බන්ධයෙන් අපකීර්තියක් ගොඩනැගෙන නිසා.

### III. ද්විරිසිභාවය- Bisexual

යම්කිසි පුද්ගලයෙක් තමන්ට සමාන ලිංගයේ පුද්ගලයන් ට වගේම විරුද්ධ ලිංගයේ පුද්ගලයන්ටද කායිකව,මානසිකව සහ ආධ්‍යාත්මිකව ආකර්ෂණය වීම තමයි බයිසෙක්ෂුවල් කියලා කියන්නෙ. එම පුද්ගලයා කොපමණ ප්‍රමානයකින් සමාන ලිංගිකයන්ට ආකර්ෂණය වෙනවද කොපමණ ප්‍රමාණයක් විරුද්ධ ලිංගිකයන්ට ආකර්ෂණය වෙනවද කියන එක හරියටම කියන්න අපහසුයි. ඒක එක් එක් පුද්ගලයාට අනුව වෙනස්වෙන්න පුළුවන්.

### IV. නිර්රිසිභාවය- Asexual

සමහර පුද්ගලයන් සිටිනවා කිසිම ලිංගික පුද්ගලයන් කෙරෙහි කායිකව,මානසිකව සහ ආධ්‍යාත්මිකව ආකර්ෂණය නොවෙන.ඔවුන් කිසිම පුද්ගලයෙක් සමඟ ලිංගිකව එක්වීම හෝ ආධ්‍යාත්මිකව සම්බන්ධතා පවත්වන්න කැමති නැහැ.

### V. බහුරිසිභාවය- Pansexual

අනෙක් පුද්ගලයන්ගේ ලිංගභාවය හෝ සමාජභාවීය අනන්‍යතාව (Gender Eternity) නොසලකා ගැහැණු/පිරිමි සංක්‍රාන්ති සමාජභාවය යන ඕනැම කෙනෙකු සමඟ කායිකව,මානසිකව හෝ ආධ්‍යාත්මික

සම්බන්ධතා පවත්වනු ලබන පුද්ගලයන් හැඳින්වීමට යොදාගන්නා වචනයයි.

- මහජනතාවට සේවය සපයනු ලබන නිලධාරියකු වශයෙන් ඔබ ඉහත පැහැදිලි කිරීම මඟින් උගත යුතු දේවල් මොනවද? ලැයිස්තු ගත කරන්න.

**<u>සමාජභාවය - Gender.</u>**

ඔබ අද ජීවත්වෙන සියලුම පුද්ගලයන්ට සමාජභාවයක් ඇත.සමාජභාවය යනුවෙන් සරලව හඳුන්වන්නේ කිසියම් පුද්ගලයෙකුගේ සමාජීය, සංස්කෘතිකමය, මනෝවිද්‍යාත්මකව එම පුද්ගලයා සමාජය තුළ පෙන්නුම් කරන කාර්යභාරයන්, චර්යාවන්, අනන්‍යතාවයන් සහ ප්‍රකාශනයන්හි එකතුවකි. තමන්ට උපතින් ලැබුණු ලිංගභාවයට අනුව සමාජය මඟින් තමන්ගෙන් බලාපොරොත්තු වන හැසිරීම් මාලාවක් තිබේ.එහ හැසිරීම් වලට එම පුද්ගලයා සමාජය තුළ පෙනී සිටින ආකාරයයි.

උදාහරණයක් ලෙස,

ඔබට උපතේදි ස්ත්‍රී ලිංගභාවයක් ලැබුනා යැයි සිතන්න.සමාජය ඔබගෙන් දියණියක්, තරුණියක්, භාර්යාවක්, මවක්, මිත්තනියක්, ගුරුවරියක්, හෙදියක් වෙනත් කාන්තාමය තනතුරක් යන අවස්ථාවල දී ඔබ ජීවත් විය යුතු ආකාරය පිළිබඳ කලින් නිර්මාණය කරගෙන ඇති ආකාරයක් ඇත.ඔබ අඳින පළඳින ආකාරය, ඔබ හැසිරෙන ආකාරය, සමාජය තුළ පෙනී සිටිය යුතු ආකාරය සම්බන්ධයෙන් සමාජය විසින් නිර්මාණය කරගත් ආකාරයක් ඇත.

- ගැහැණු ළමයෙක් මෙහෙම වාඩිවෙන්න.
- ගැහැණු ළමයෙක් කෑගහල හිනාවෙන්නෙ නැහැ,
- ගවුම හදාගෙන වාඩිවෙන්න.
- කොණ්ඩය වවන්න ඕනෙ. මෙන්න මේ ආකාරයට ලිංගභාවයට සමාජය ලබාදෙන අගයයන් කාර්යභාරයන් සහ භූමිකාවලට තමයි සමාජභාවය කියන්නෙ.

ඉස්සර කාලෙදී මේ Gender කියන එකට ස්ත්‍රී පුරුෂ සමාජභාවය කියල කිවුවත් දැන් කියන්නෙ සමාජභාවය කියලා.ඒකට හේතුව ඔයාල දන්නවා දැන්.ස්ත්‍රී සහ පුරුෂ කාණ්ඩ දෙකට අමතරව වෙනස් අනන්‍යතා තියෙන අය ඉන්නවා කියල දැන් ඔබ දැනුවත්.

## Gender Identity- සමාජභාවීය අනන්‍යතාවය.

සෑම පුද්ගලයෙකුට සමාජභාවීය අනන්‍යතාවයක් තියෙන බව ඔබ දන්නවාද ඔබගේ සමාජභාවීය අනන්‍යතාව මොකක්ද කියලා. සමාජභාවීය අනන්‍යතාවය කියන්නෙ පුද්ගලයෙකු සමාජය තුළ ජීවත් වීමට තමන්ට දැනෙන්නේ කවුරුන් වගේද කියන .උපතින් ඔබට ලැබුණු ලිංගභාවය සමඟ සෑමවිටම ඔබගේ සමාජභාවය ගැළපෙන්නෙ නැති වෙන්න පුළුවන්. එය සාමාන්‍යයි.ලෙඩක් නෙමෙයි. උදාහරණයක් ලෙස,

පුරුෂලිංග භාවයක් ලැබුණු කෙනෙකුට තමන්ව කාන්තාවක් විදිහට දැනෙන්න පුළුවන්. ඒ වගේම තමන්ට දැනෙන ආකාරය පිළිඅරගෙන ඒ

අනුව ජීවත්වීම තෝරාගන්න පුළුවන්. උපතින් ලැබුණු ලිංගභාවයට ගැළපෙන විදිහට මනස සකස් වුණ අය වගේම වෙනස් අනන්‍යතාවන් දරන අයටද සමාජයේ ජීවත්වෙන්න අයිතිවාසිකම් තිබෙනවා. ඔවුන්ටද මනුෂ්‍යයෙකු ලෙස උපතින් ලැබිය යුතු මූලික අයිතිවාසිකම් භුක්ති විදීමට පුළුවන් වගේම එය ඔවුන්ගෙන් උදුරාගැනීමට ඔබට අයිතියක් නැති බව මතක තබාගන්න ඕන.

දැන් අපි බලමු මොනවද මේ සමාජභාවීය අනන්‍යතාවයන් කියලා.

i. Cis gender- ස්ථිතික සමාජභාවය
ii. Transgender- සංක්‍රාන්තික සමාජභාවය
iii. Gender no corning- තහවුරු නොකරන ලද සමාජභාවය
iv. Gender non binary- ද්වීමය නොවන සමාජභාවය
v. A gender- නිර්සමාජභාවය

## i. <u>Cis gender- ස්ථිතික සමාජභාවය</u>

උපතින් ස්ත්‍රීයක හෝ පුරුෂ යෙකු ලෙස ලිංගභාවය පවරා දෙනු ලැබූ පුද්ගලයෙකු ම සමාජය විසින් එම පුද්ගලයන්ගෙන් බලාපොරොත්තු වන ආකාරයටම ජීවත්වීම එසේත් නැත්නම් ස්ත්‍රීයක් හෝ පුරුෂයෙකු ලෙස සමාජය විසින් බලාපොරොත්තු වන ආකාරයට ජීවත්වීම තමන්ව ඒ ආකාරයෙන් දැනීම, තේරුම් ගැනීම සහ තමන්ගේ හැසිරීම්, අඳින පළඳින ආකාරය පවත්වාගෙන යාමයි. සමාජයේ බහුතරයක් පුද්ගලයන් මොවුන් වන අතර සමාජය තුළ ස්ථාපිත ආදර්ශ සමාජභාවය (Gender Stereotype) ලෙසද සැලකෙන්නේ මෙයයි. සමාජය තුළ සාමාන්‍ය යැයි

හඳුනාගන්නේ ඔවුන්ව වන අතර අයිතිවාසිකම් සම්බන්ධයෙන් ගැටළු නොමැත. ශ්‍රී ලංකාව වැනි පෙරදිග රටවල්වල භාවිත සමාජ ක්‍රමයට නිර්මාණය වී තිබෙන්නේ මෙම ස්ජීතික සමාජභාවය තහවුරු කරන සහ පවත්වාගෙන යාමට වේ.

## ii. Transgender- සංක්‍රාන්තික සමාජභාවය

මීට පෙර ඔබ සංක්‍රාන්තික සමාජය යනු කුමක්දැයි ඉගෙන ගත්තා මතකයි නේද? ආයෙත් මතක් කරනවානම්, උපතේදී ලැබුණු ලිංගභාවයට විරුද්ධ පුද්ගලයෙකු ලෙස තමන්ව දැනීම,තේරුම් ගැනීම සහ පෙනී සිටීමයි. මෙය ඉතා අසීරු සහ සමාජයෙන් කොන්වීමට හේතුවන තත්ත්වයකි. මනෝවෛද්‍යවරුන් පවසන ආකාරයට මිනිස් මොළයේ රසායනික සංයුතිය වෙනස්වීම මඟින් කිසියම් පුද්ගලයෙකුට තමන් උපතින් ලද ලිංගභාවයට ප්‍රතිවිරුද්ධ පුද්ගලයෙකු ලෙස තමන්ව දැනිය හැකිය. එය රෝගයක් නොවන තත්ත්වයකි.

## සංක්‍රාන්තිය - Transitioning.

සංක්‍රාන්තිය කියන්න තමන් වෙනස් පුද්ගලයෙකු / එහෙමත් නැත්නම් තමන් උපතින් ලැබුණු ලිංගභාවයට ප්‍රතිවිරුද්ධ සමාජභාවීය අනන්‍යතාවයක් දරන බව තේරුණාට පස්සේ ඔවුන් තමන්ගේ මනසින් දැනෙන පුද්ගලයෙක් බවට පත්වීමේ සම්පූර්ණ ක්‍රියාවලියයි.
හිතන්නකෝ ඔබ ස්ජීතික සමාජභාවීය කෙනෙක් කියලා. එතකොට ඔයාට තමන්ගේ අනන්‍යතාවය ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ.

ඔයා ඉපදෙනවා, ලොකු වෙනවා, ඉස්කෝලෙ යනවා, ඔයාගෙ ලිංගභාවයට ගැළපෙන විදිහට සෙල්ලම් කරනවා, ඇඳුම් අඳිනවා, පාසලේදී හෝ සමාජයේදී ඔයාට ඔයාගේ "විදිය" අනුව කිසිම ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. ඔයා ස්ත්‍රීයක් හෝ පුරුෂයෙකු ලෙස ජීවත්වීම ඔබට ප්‍රශ්නයක් නැහැ.

ඒත් හිතන්නකෝ ඔයාට චූටි කාලේ ඉඳලම දැනුනොත් ඔයාට උපතින් ලැබුණු ලිංගභාවය අනුව නෙමෙයි ඔයාට දැනෙන්නේ ඔයා ප්‍රතිවිරුද්ධ ලිංගයේ කෙනෙකු විදිහට කියල අන්න එතැනදි තමයි ඔයා ලොකු අභියෝගයකට මුහුණ දෙන්නේ.මොකද?,

ඔයාට සමාජ ප්‍රශ්න තියෙනවා. නිල්පාට ඇඳුම්, සෙල්ලම් තුවක්කු, ඩෝසර්, බෝල වැනි දේවල් තෑගි ලැබෙනවා. සපත්තු, කලිසම්, ෂර්ට් ලැබෙනවා, ඔයා ලස්සන පුතෙක් විදිහට සමාජය බලාපොරොත්තු වෙනවා. ඔයා දුවෙක් වුණොත් ඔයාට රෝස පාට ඇඳුම්, බෝනික්කන්, ලස්සන බෑන්ඩ්, වළලු, සෙල්ලම් ගෙදර උයන හැලි වළං, සින්ඩරෙල්ලා බෑග්ස්, කරාබු වගේ දේවල් ලැබෙනවා. ඔයාව ලස්සන දුවෙක් විදිහට තමයි සමාජය ඔයාගෙන් බලාපොරොත්තු වෙන්නෙ.

ඒත් පුතෙක් විදිහට ඉපදිලා ඔයාට චූටි කාලේදීම දැනුනොත් දුවෙක් විදිහට අන්න එතැනදි ඔයා අසරණ වෙනවා. මොකද සමාජය ඔයා වගේ අයට ජීවත් වෙන්න පුළුවන් ක්‍රමයක් හදල නැහැ. මෙන්න මෙහෙම ඔයා වෙනස් කෙනෙක්. ඔයාට ඔයාට උපතින් ලැබුණු ලිංගික අනන්‍යතාවයට වඩා ප්‍රතිවිරුද්ධ කෙනෙකු විදිහට මනසට හෝ දැනෙන්නේ කියලා

තේරුම් ගැනීම, තමන්ගේ අනන්‍යතාව පිළිගැනීම සහ එහෙම ජීවත්වීමට පටන්ගැනුම තමයි,

- <u>ආත්මීය සංක්‍රාන්තිය- **self-transition** </u>කියලා කියන්නෙ.

මේ ආත්මීය සංක්‍රාන්තිය ඉතාම අමරා ක්‍රියාවලියක් මොකද තමන් වෙනස් කෙනෙක්, මොකද්ද මට මේ වෙන්නෙ, ඇයි මට මාව උපතේදි ලැබුණු ලිංගික අවයවයට අනුකූල කෙනා විදිහට නොදැනෙන්නෙ කියලා තේරුම් ගන්න එක ඉතාම සංකීර්ණ සහ අපහසු ක්‍රියාවලියක්. අපේ රටවල්වල මේ වගේ දේවල් පාසල් වල උගන්වන්නෙ නැහැ. දෙමාපියන්, ගුරුවරුන් දැනුවත් නැහැ. මොකද්ද මේ සංක්‍රාන්තිය කියන්නෙ කියලා. ඒ නිසා මේ වගේ තත්ත්වයට පත්වන්නේ බොහෝ සංක්‍රාන්ති පුද්ගලයන් විශාල පීඩනයකට ලක් වෙනවා. තමන්ව ප්‍රශ්න කරගනිතමන්ට රෝගයක් හෝ මානසිකව තමන් දුර්වල පුද්ගලයෙකු ලෙස සිතනවා. මේ කාල සීමාවේදී තමන් සමගම අරගල කරමින් ඉන්නකොට පවුලෙත්, සමාජයෙත්, පාසලෙත් ලැබෙන්නෙ විශාල පීඩනයක්.

"උඹ කොල්ලෙක් මොකද ඔය ගෑනියෙක් වගේ හැසිරෙන්නේ?"
"අපේ පවුලටම අවනම්බුවක් උඹවගේ කෙනෙක් "
"නංගි මල්ලියෙක්"
"සමාජ පිළිලක්"
"උඹ නම් අපේ පරම්පරාවේ නෙමෙයි "
"මූට බෙහෙත් අරන් දෙන්න ඕන" යනාදි විදිහට පිරිමි ළමයෙක් ලෙස ඉපදිලා ගැහැණු ළමයෙක් විදිහට තමන්ගේ මනසට දැනෙන දරුවන්ට සමාජයෙන් විශාල පීඩනයක් එල්ල කරනවා.

"කෙල්ලෙක් වුණාම සංවර වෙන්න ඕන, ගෙදර වැඩ කරන්න පුළුවන් වෙන්න ඕනි "

"පිරිමි භාගයක් වෙන්න හදනවා"

"කෙල්ලෙක් කොටට අඳින්න එපා,ගවුම් අඳින්න,කලිසම් අඳින්න එපා "

"හොඳට උයන්න පුරුදු වෙන්න, අම්මා කෙනෙක් වෙන්න ඕන දේවල් පුරුදු වෙන්න " යනාදී ලෙස ගැහැණු කෙනෙක් විදිහට ඉපදිලා මනසින් තමන්ව පිරිමි ළමයෙක් විදිහට අඳුරන අයට සමාජය බලපෑම් කරනවා.

මෙන්න මේ සමාජභාවී බලපෑම් නිසා බොහෝ සංක්‍රාන්ති සමාජභාවි දරුවන් විශාල මානසික ආතතියකින් ජීවත් වෙනවා.තමන් කවුද කියලා තේරුම් ගන්න ඔවුන්ට දැනුම, තොරතුරු හෝ සේවාවන් ලබා ගන්නට නැහැ.තමන්ව නිතරම වැරදිකාරයෙක්, කරුමක්කාරයෙක් විදිහට සමාජය දකින එක ඔවුන්ට දරාගන්න බැහැ. පවුලෙන්, පාසලෙන්, සමාජයෙන් කොන් වෙන එක, ලැජ්ජාවට පත්වන එක දරාගන්න බැහැ. මේ නිසා තමන්ව තමන් විදිහට සංක්‍රාන්ති වෙන්න ලංකාවේ දරුවන්ට ඉතාම අපහසුයි.කොහෙද හරි මේ බාධක ඔක්කොම දරාගෙන"තමන් තමන් ලෙසම" තේරුම් ගැනීම සහ සංක්‍රාන්තික වීමට තමයි ආත්මීය සංක්‍රාන්තිය කියන්නෙ. මේක හරියට තමන් මානසිකව හිර කරලා තිබුණ කූඩුවකින් එළියට එනවා වගේ දෙයක්.

* ආත්මීය සංක්‍රාන්ති ක්‍රියාවලිය පහසු සහ මානසික පීඩනයකින් තොරව සිදු කරගැනීමට ඔබට යෝජනා කළ හැකි දේවල් මොනවද යන්න සිතන්නට ඔබටම හැකියාව තිබෙනවා.

- <u>නෛතික සංක්‍රාන්තිය - **Legal Transitioning.**</u>

කිසියම් පුද්ගලයෙකු ආත්මීය සංක්‍රාන්ති අවස්ථාව පසු කරමින් තමන් සංක්‍රාන්ති කෙනෙකු ලෙස තමන්ට හා සමාජයට ප්‍රකාශ කර පසු (එලෙස ප්‍රකාශ කිරීම අවශ්‍යම නැත). ඒ ආකාරයෙන් ජීවත්වීම පහසු නැත. සමාජය විසින් ඔවුන්ගේ අනන්‍යතාවය ප්‍රශ්න කරමින් සිටින නිසා තමන්ගේ අනන්‍යතාව ඔප්පු කිරීමට හැකි ආකාරයට සකස් කිරීම සිදු කරගත යුතුය. එහිදී විවිධ බාධක වලට මුහුණ දීමට ඔවුන්ට සිදු වේ.

ශ්‍රී ලංකාවේ එම ක්‍රියාවලිය කුමක්දැයි දැන් බලමු.කිසියම් පුද්ගලයෙකු ආත්මීය සංක්‍රාන්ති අවධිය පසුකලාට පසු ඔහු හෝ ඇය තමන්ගේ අනන්‍යතාව තහවුරු කරගත යුතුවේ.මේ සඳහා ඔවුන් රජයේ දිස්ත්‍රික් රෝහලක මානසික සෞඛ්‍ය සායන වල ලියාපදිංචි විය යුතුය. එම රෝහල් පහත පරිදි වේ.

- කොළඹ ජාතික රෝහල
- නවෝදයා රෝහල
- පේරාදෙණිය ශික්ෂණ රෝහල
- දකුණු කොළඹ ශික්ෂණ රෝහල
- උතුරු කොළඹ ශික්ෂණ රෝහල
- ගම්පහ දිස්ත්‍රික් රෝහල
- කරාපිටිය ශික්ෂණ රෝහල
- මඩකලපුව දිස්ත්‍රික් රෝහල
- වවුනියාව දිස්ත්‍රික් රෝහල
- මහනුවර දිස්ත්‍රික් රෝහල
- යාපනය ශික්ෂණ රෝහල

එම මානසික සෞඛ්‍ය සායනයේ ලියාපදිංචි වුවාට පසු විශේෂ මනෝ වෛද්‍යවරයෙකු විසින් අදාළ පුද්ගලයා සැලකිය යුතු කාල සීමාවකදී සංක්‍රාන්තිය සඳහා සූදානම් කරවයි. මෙහිදී විශේෂ වෛද්‍යවරයා සැහීමට පත්වන තෙක් මාසයකට වතාවක් අදාළ පුද්ගලයා සායනයට ගොස් විශේෂඥ මනෝ වෛද්‍යවරයාගේ පරීක්ෂණ වලට සහභාගි විය යුතුය.

i. උපදේශනය.
ii. සංක්‍රාන්තික ක්‍රියාවලිය සඳහා මනස සකස් කිරීම.
iii. හෝමෝන ලබා ගැනීමට නිර්දේශ කිරීම.
iv. ශාරීරික වෙනස්කම්,කටහඬ,දේහ ලක්ෂණ පරීක්ෂා කිරීම.
v. සමාජගත වීමට සූදානම් කිරීම යනාදී වශයෙන්

මෙම ක්‍රියාවලිය පියවර රාශියකින් සමන්විත වේ.මෙම ක්‍රියාවලිය මාස ගණනාවක් ගත විය හැකි ඉතාම සංකීර්ණ ක්‍රියාවලියකි. බොහෝ වෙහෙසකර සහ මානසික පීඩනයකින් යුතුව සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයා ගත කරන කාල සීමාවකි.හෝමෝන ලබා ගැනීමත් සමඟ මානසිකව සහ කායිකව සිදුවන වෙනස්කම් දරාගැනීම හා එයට මුහුණ දීම,රෝහල් කාර්යමණ්ඩලයේ සිදුවනකොන්කොට සැලකීම් සහ වෙනස්කොට සැලකීම් දරාගැනීම,පවුලෙන් හා සමාජයෙන් එල්ලවන චෝදනා, හිරිහැර වෙනස්කොට සැලකීම දරාගැනීම,රැකියා වලින් නෙරපා දැමීම,අධ්‍යාපන අවස්ථා හීනවීම යනාදී විවිධාකාර අභියෝගවලට මුහුණ දීමට සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ට සිදුවන කාල සීමාවකි.

මෙම සියලුම අභියෝග අවසානයේ දී සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයාට විශේෂඥ මනෝ වෛද්‍යවරයාගේ අත්සනින් සහ අදාළ රෝහල් අධ්‍යක්ෂකවරයාගේ සහතික කිරීමෙන් ලැබෙන සහතිකය සමාජභාවය හඳුනාගැනීමේ සහතිකය (Gender Recognition certificate) යනුවෙන් හැඳින්වේ. GRC යනුවෙන් හඳුන්වන්නේ මෙයයි. මෙම GRC ලබාගැනීම සංක්‍රාන්ති පුද්ගලයෙකුගේ ජීවිතයේ වැදගත් කඩයිමක් වේ. ඉන්පසු මෙම GRC සහතිකය ඉදිරිපත් කිරීම මඟින් උප්පැන්න සහතිකය සංශෝධනය කර ගැනීමට සංක්‍රාන්ති පුද්ගලයාට අවස්ථාව හිමි වේ. පැරණි උප්පැන්න සහතිකයේ නම / ලිංගභාවය වෙනුවට අලුත් උප්පැන්න සහතිකයක් ලබාගැනීමටත් එහි තමන්ගේ නම අනන්‍යතාව තහවුරු කරගැනීමත් අවස්ථාව හිමි වේ. ඉන්පසුව සංශෝධනය කරන ලද උප්පැන්න සහතිකය සහ GRC එක ඉදිරිපත් කිරීම හරහා නව හැඳුනුම්පතකට අයදුම් කිරීමට හැකිය. මෙය තරමක් කරදරකාරී සහ බොහෝ සංක්‍රාන්ති පුද්ගලයන් අපහසුතාවයට පත්වන අවස්ථාවක් ලෙස දැකිය හැකිය.

බොහෝ ඉහළ නිලධාරීන් මෙම සංක්‍රාන්තික ක්‍රියාවලිය සහ GRC ගැන දන්නෙ නැති නිසා හැඳුනුම්පත් වෙනස් කර ගැනීමේ ක්‍රියාවලියේදී සංක්‍රාන්ති පුද්ගලයන් විශාල අපහසුතාවලට ලක්වන බවට පැමිණිලි ලැබේ.

මීට අමතරව සංක්‍රාන්ති පුද්ගලයන්ට විභාග සහතික, උපාධි සහතික යනාදීය වෙනස් කරගැනීමටද මෙම නිතිමය සංක්‍රාන්තිය යටතේ අවස්ථාව ලැබේ.  නීතිමය සංක්‍රාන්තිය අත්‍යවශ්‍ය දෙයක් නොවේ.

එහෙත් සංක්‍රාන්ති පුද්ගලයන්ට තමන්ගේ සිවිල් සහ දේශපාලනික අයිතිවාසිකම් දිනාගැනීම සඳහා මෙම නෛතික සංක්‍රාන්තිය අත්‍යවශ්‍ය වේ.එහෙත් නෛතික සංක්‍රාන්තිය තරමක් අපහසු සහ පීඩාකාරී ක්‍රියාවලියක් නිසා GRC එක ලබා නොගත් සංක්‍රාන්ති පුද්ගලයන් විශාල ප්‍රමාණයක් සිටින බව දැනගත යුතුය.

බොහෝ සේවාවන් ලබාගැනීමට හෝ වෙනත් ආකාරයකින් සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයෙකු හමුවුවහොත් ඔවුන් සියලු දෙනාට GRC සහතික නොමැති බව සිහි තබාගැනීම.

- <u>වෛද්‍ය සංක්‍රාන්තිය-**Medical Transitioning**</u>

වෛද්‍ය සංක්‍රාන්තිය කියන්නෙ හෝමෝන ප්‍රතිකාර සහ සැත්කම් මාර්ගයෙන් සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයෙකු තමන් වර්තමානයේදී පෙනී සිටින අනන්‍යතාවයට ගැලපෙන ආකාරයෙන් සකස් කිරීමේ ක්‍රියාවලිය යි.

උපතේදී පුරුෂ ලිංගයක් ලැබුණු පුද්ගලයෙකු ඊස්ට්‍රජන් සහ ඇන්ඩ්‍රොජන් නොමැති (Anti-Androgens) හෝමෝන භාවිතා කිරීම මඟින් තමන්ගේ බාහිර පෙනුම කාන්තාවක් ලෙස වෙනස් කරගනි.එහිදී ඊස්ට්‍රජන් මඟින් කාන්තාමය ස්වරූපය ලැබෙන ආකාරයට පිටත පෙනුම, කටහඬ, සමේ පැහැය යනාදි ඇන්ටි ඇන්ඩ්‍රෙජන් මඟින් ටෙස්ටස්ටරෝන් පාලනය කිරීම සිදු කරයි.

උපතේදී ස්ත්‍රී ලිංගභාවය ලැබුණු පුද්ගලයෙකු තමන්ගේ වර්තමාන අනන්‍යතාව පුරුෂයෙකු ලෙස සකස් කරගැනීම සඳහා ටෙස්ටස්ටරෝන් හෝමෝන පිටතින් ලබා ගනී. එමගින් ඔවුන්ගේ රැවුල වැවීම, ශරීරයේ

රෝම වර්ධනය වීම සහ කටහඬ වෙනස්වීම යනාදිය සිදු වේ. මෙම හෝමෝන භාවිතා කිරීම වෛද්‍ය උපදෙස් මත පමණක් සිදු කළ යුතු අතර හෝමෝන ලබාගැනීම හරහා ශරීරයේ පිටත පෙනුම වෙනස්වීම සහ අනෙකුත් වෙනස්කම්වලට කාලයක් ගතවිය හැකි අතර එය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ.

එමෙන්ම හෝමෝන ලබා ගන්නා මුල් අවධියේදි ඉතා විශාල ප්‍රමාණයේ ශාරීරික අපහසුතා සිදුවන බව මතක තබාගත යුතුයි. ඔක්කාරය, වමනය, උෂ්ණ බිබිලි දැමීම, කකුල් කැක්කුම, පිටකොන්ද අමාරුව, අධික නිදිමත, අධික පිපාසය, ඔසප් චක්‍රය අක්‍රමත්වීම, තරහ යාම, ක්ෂණික කෝපය, කංසාව, මානසික අවපීඩනය යනාදී විවිධ ශාරීරික හා මානසික වෙනස්කම් වලට භාජනය වන අවධියකි. එම නිසා සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාව හෝමෝන ලබාගන්නා මුල් කාල සීමාවේදී සහයක පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් යටතේ රැකබලා ගැනීම ඉතාම වැදගත් වේ.

වෛද්‍ය සංක්‍රාන්තියේ දෙවන පියවර වන්නේ සැත්කම් සිදුකරගැනීම හරහා සිදුවන ලිංගික ඉන්ද්‍රියයන් වල සිදුවන වෙනස්කමයි. මේවා,

- පියවුරු ඉවත්කිරීම හෝ වර්ධනය කිරීමේ සැත්කම්
- ලිංගික අවයිය නැවත සකස් කරන සැත්කම් ලෙස කොටස් දෙකකි.

ස්ත්‍රී ලිංග සමයේ පුරුෂ ලිංගභාවයට සංක්‍රාන්ත වූ පුද්ගලයන් තමන්ගේ පියයුරු ඉවත් කිරීමේ සැත්කම් සිදුකරනු ලබන අතර පුරුෂ ලිංගභාවයේ සිට ස්ත්‍රී ලිංගභාවයට සංක්‍රාන්ත වූ පුද්ගලයන් තමන්ගේ පියවුරු

වර්ධනය කරගනිමින් සැත්කම් වලට මුහුණ දෙයි.මෙම සැත්කම් සිදුකිරීම අනිවාර්ය නොවන අතර සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයෙකු ලෙස හඳුනාගැනීමට හෝ නීතිමය වශයෙන් පිළිගැනීමට GRC එක ප්‍රමාණවත් වේ. මීට අමතරව ලිංගික අවයව සකස් කරගෙන සැත්කම් දැන් ක්‍රියාත්මක වන අතර ශ්‍රී ලංකාවේ මේ තරම් දායකත්වයක් හෝ උපකාර මෙම ලිංගික අවයව ස්ථාපනය කිරීමේ සැත්කම් සඳහා ලබා දෙන්නේ නැහැ. එමෙන්ම මෙම ලිංගික අවයව සකස් කිරීමේ සැත්කම් ඉතාමත් මිල අධික සහ සංකීර්ණ ක්‍රියාවලියක් බවද මතක තබාගත යුතුය.

මෙලෙස පියයුරු ඉවත් කිරීමේ හෝ වර්ධනය කිරීමේ සැත්කම් සහ ලිංගික අවයව නැවත සකස් කිරීමේ සැත්කම් යන දෙවර්ගයම සම්පූර්ණ කරගත් පුද්ගලයන් සංක්‍රාන්තික ලිංගික (Transsexual) ලෙස හඳුන්වයි. එහෙත් සේවාවන් සපයන නිලධාරින් වශයෙන් ඔබ එම පුද්ගලයන්ට සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවක් යනුවෙන් හැඳින්වීම ප්‍රමාණවත්ය.
කිසිම අවස්ථාවක ඔවුන්ගෙන් "ඔබ හෝමෝන ලබා ගන්නවද?, ඔබ ලිංගික අවයව වෙනස් කරලද?" යන ප්‍රශ්න ඇසීම සිදු කරන්න එපා. හෝමෝන ලබාගැනීම හෝ සැත්කම් සිදුකර ගැනීම සංක්‍රාන්ති සමාජභාවී ක්‍රියාවලියේ අනිවාර්ය අංගයක් නොවේ.

* මෙම පරිච්ඡේදය ඔබ ඉගෙනගත් කරුණු 05ක් දක්වන්න.

……………………………………………………………………

……………………………………………………………………

……………………………………………………………………

………………………………………………………………

………………………………………………………………

* <u>වැදගත්</u>

- සංක්‍රාන්ති සමාජභාවය යනු තෝරාගැනීමක් නොවේ.
- සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයෙකු වන්නේ කර්මය හෝ පින් පව් අනුව නොවේ.
- සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයෙකු වීම යනු මානසික රෝගයක්ද නොවේ.
- සංක්‍රාන්තිය යනු බොහෝ කාලයක් තුළ සිදුවන ක්‍රියාවලියකි.
- එය නිවැරදි මඟ පෙන්වීම හා මාර්ගෝපදේශය මත සිදුවිය යුතු ක්‍රියාවලියකි.

<u>**iii. Gender non-conforming-** තහවුරු නොකරන ලද සමාජභාවය</u>

මෙයින් අදහස් වන්නේ තමන්ගේ සමාජභාවීය අනන්‍යතාව තවමත් හඳුනානොගත් හෝ තහවුරු කර නොමැති පුද්ගලයන් සිටිය හැකි බවයි. පුද්ගලයන්ගේ ලිංගික හෝ සමාජීය අනන්‍යතාව හඳුනාගැනීමට හෝ තේරුම් ගැනීමට පහසු ආකාරයෙන් අධ්‍යාපනික හෝ තොරතුරු මූලාශ්‍ර ශ්‍රී ලංකාව වැනි රටවල්වල නොමැති වීම නිසා බොහෝ පුද්ගලයන් තමාගේ සැබෑ සමාජභාවී අනන්‍යතාව හඳුනාගැනීමේ ගැටළු වලට මුහුණ දෙමින් සිටී. මෙම තත්වය සමහරවිට ඔවුන්ගේ ජීවිත කාලය පුරාම සිදු කරනු ලබන ගවේශනයක් ද විය හැකිය.

## iv Gender non-binary - ද්වීමය නොවන සමාජභාවය

සාම්ප්‍රදායිකව "ස්ත්‍රී " හෝ "පුරුෂ " යන සමාජභාවීය අනන්‍යතාව සමඟ ගැලපෙන්නේ නැති පුද්ගලයන් හඳුන්වන අනන්‍ය පදයකි. ද්වීමය නොවන අනන්‍යතා ඇති පුද්ගලයන්,සමහරවිට ඔවුන්ට ස්ත්‍රී හා පුරුෂ යන දෙපාර්ශවයේම ගති ලක්ෂණ ඇති බවට තේරුම්ගත හැකි අතර එසේත් නැත්නම් ස්ත්‍රී හෝ පුරුෂ යන කාණ්ඩ දෙකේ අතරමැදි තත්ත්වයක සිටිය හැකි බවට තේරුම් ගනී. මෙය ප්‍රතිකාර ගත යුතු හෝ වෙනස් කළ යුතු තත්ත්වයක් නොවේ.

## v Agender- නිර්සමාජභාවය

පුද්ගලයෙකුට කිසිම ආකාරයේ සමාජභාවීය අනන්‍යතාවයක් නොමැති වීම සරලව හැඳින්විය හැකිය. සමාජභාවය යනු ඔවුන්ගේ ජීවිතයට අදාළ කොටසක් නොවේ.

## Sexual Expression - ලිංගික ප්‍රකාශන

පුද්ගලයන් තමන්ගේ ලිංගිකමය හෝ සමාජභාවීය අනන්‍යතාව බාහිරට ප්‍රකාශනය කරන විවිධාකාර පවතී.සාම්ප්‍රදායිකව ස්ත්‍රීය හෝ පුරුෂයා තමන්ගේ අනන්‍යතාවය ප්‍රදර්ශනය කිරීමට විශේෂ උත්සාහයක් නොගත් අතර ඔවුන්ගේ හැසිරීම, කතා විලාශය, ඇඳුම් පැළඳුම් සමාජය තුළ නිරතවන භූමිකා යනාදියෙන් නිසැකින් ලිංගික ලක්ෂණ බාහිර සමාජයට පෙනුන අතර බාහිර සමාජයද ඒවා හඳුනා ගන්නා ලදී.

එහෙත් ස්ත්‍රී හෝ පුරුෂ අනන්‍යතා ලෙස තමන් හඳුන්වා නොගන්නා තමන් සංක්‍රාන්ති සමාජභාවය ද නොවන පුද්ගලයන් සිටින අතර ඔවුන්

ද ඔවුන්ගේ අනන්‍යතාවය මත පදනම්ව විවිධාකාර හිංසාවලට මුහුණ දෙන පුද්ගලයන් වේ.

මෙම ලිංගික ප්‍රකාශන පුද්ගලයන් චිත්තපේශිමය, ශාරීරිකව, වාචිකව හා අවාචිකව යනාදී විවිධ ආකාරයෙන් ප්‍රකාශ කරන අතර ඒවා එක් එක් පුද්ගලයන්ගේ අනන්‍යතාව අනුව වෙනස්විය හැකිය. එමෙන්ම ලිංගික ප්‍රකාශන සමාජය තුළ පවතින අගයයන්, සංස්කෘතිය, විශ්වාස සහ රුචිකත්වයන් අනුවද වෙනස් වේ.

ලිංගික ප්‍රකාශන විවිධ ස්වරූප ගනී.

- චර්යාව - වැළඳ ගන්නා ආකාරය, සිප ගැනීම්, ස්පර්ශ කිරීම්, ඉඟිබිඟි පෑම්, යනාදිය මඟින්
- සන්නිවේදනය - තමන් කැමති දේවල් කතාකරන ආකාරය, රුචි අරුචි දේවල් හෝ ස්ථාවන්
- ඇඳුම් පැළඳුම් සහ විලාසිතා - තමන්ගේ ලිංගික අනන්‍යතාව පෙන්නුම් කරන ආකාරයේ වෙනස් සහ ආකර්ශනිය ඇඳුම් පැළඳුම් සහ ආභරණ

## Androgynous- ඇන්ඩ්‍රොජිනස්.

සාම්ප්‍රදායික ස්ත්‍රී සහ පුරුෂ යන ආකාර දෙකෙහිම සම්මිශ්‍රණයක් සහිත ප්‍රකාශන සහිත පුද්ගලයින්, බාහිර පෙනුම, විලාසිතා, ආභරණ, කතාබහ යනාදිය ස්ත්‍රී හා පුරුෂ යන ආකාර දෙකෙහිම එකතුවක් ලෙස ප්‍රකාශනය කරන පුද්ගලයින්.

- සම්පූර්ණ වශයෙන් ස්ත්‍රී හෝ පුරුෂ ලෙස හඳුනාගත නොහැකි ආකාරයට ඇඳුම් ඇඳීම

- කිසියම් පුද්ගලයෙකුගේ මුහුණේ ඉරියව්, හැඩතල, කටහඬ හෝ හැසිරීම ස්ත්‍රී හෝ පුරුෂ යන කියන දෙකෙන් එකක් සමඟ සීමිත නොවීම.

මෙම පුද්ගලයන් සමාජය තුළ බොහෝ අවස්ථාවලදී කොන්වීමට හා වෙනස්කොට සැලකීමට භාජනය වේ.සාම්ප්‍රදායික ස්ත්‍රී හෝ පුරුෂ යන ආකෘති දෙකෙන් එකකට සීමා නොවීම නිසා සමාජය විසින් ඔවුන් "අමුතු" පුද්ගලයන් ලෙස හඳුනාගෙන ඔවුන්ට විවිධ උසුලු විසුලු කිරීම නිරන්තරයෙන් සිදුවේ.

## <u>Nachchi - නච්චි ප්‍රජාව</u>

ලිංගික අනන්‍යතාව ලෙස මෙන්ම විවිධ සමාජභාවීය අනන්‍යතාවල එක් ස්වරූපය ලෙසද ගත හැකි "නච්චි" ප්‍රජාව යනු ශ්‍රී ලංකාවේ සංස්කෘතිය හා ඉතිහාසය සමඟ බැඳුණු සාම්ප්‍රදායික ප්‍රජාවකි. එමෙන්ම ඉතිහාසයේ සිටම විවිධ කොන්කොට සැලකීම් සහ වෙනස්කොට සැලකීම්වලට භාජනය වූ සමහර ලිංගික කණ්ඩායමකි.
ලිංගභාවය පුරුෂ ලෙස උපත ලැබුවද කාන්තා ගති ලක්ෂණ සහ පෙනුම ඇති මෙම පුද්ගලයන් සංක්‍රාන්ති ක්‍රියාවලියට යාමට අකමැත්තක් දක්වා පුද්ගලයන් වන අතර බොහෝ විට කණ්ඩායම් වශයෙන් සිටීමට වැඩි කැමැත්තක් දක්වයි. ඉන්දියාවේ "හිජ්‍රා" ප්‍රජාව හා සමානව ශ්‍රී ලංකාවේ නච්චි ප්‍රජාවටද සියවස් ගණනාවක ඉතිහාසයක් තිබේ.

රාජධානි කාලසීමාව තුළ අන්තඃපුරය පාලනය කිරීමට හා දොරටු පාලකවරු ලෙස "නච්චි" ප්‍රජාව යොදාගෙන ඇති අතර බොහෝ අවස්ථාවලදී ඔවුන්ව හඳුනාගන්නේ පෙරහැර යනාදී උත්සව

අවස්ථාවලදී විවිධ ඉදිරිපත් කිරීම් කරන පුද්ගලයින් ලෙසය. වර්තමානයේ පෙරහැර සංස්කෘතිය තුළ ජනප්‍රියව පවතින "අශ්ව නැටුම" සහ "මොනර නැටුම" බොහෝ අවස්ථා වලදී ඉදිරිපත් කරන්නේ මෙම නච්චි ප්‍රජාව විසිනි.

ශ්‍රී ලංකාවේ කඳුකරයේ හා කොළඹ අර්ධ නාගරික සහ පැල්පත් ප්‍රදේශවල නච්චි ප්‍රජාව කණ්ඩායම් වශයෙන් ජීවත්වෙන අතර ශ්‍රී ලංකාවේ LGBTIQ+ ප්‍රජාවේ පැරණිතම සාම්ප්‍රදායන් ආරක්ෂා කරන පුද්ගලයන් ලෙස හැඳින්වීම හැකිය. ඔවුන් සමාජය තුළ කොන්කිරීමට ලක් වුවද සංස්කෘතික විකාශනය තුළදී හඳුනාගැනීමට ලක්ව ඇති සුළුතර ලිංගික කණ්ඩායමක් වේ.

සංස්කෘතික ඉදිරිපත් කිරීම් කොපමණ සිදුකළද නච්චි ප්‍රජාව විශාල ආකාරයෙන් වෙන්කොට සැලකීම්, හිංසන හා සමාජය තුළ බහිෂ්කාරතාවයට ලක්වන ප්‍රජාවක් ලෙස හැඳින්විය හැකිය. ලිංගික රැකියා කිරීමට මාර්ගයේ සිදුකරන ඉදිරිපත් කිරීම්වලට බලහත්කාරයෙන් ඔවුන්ට යොමු කරවන අතර රැකියා වෙළඳපොළ තුළ ඉල්ලුමක් හෝ අවස්ථාවක් ලබාගැනීමට ඉතාම අපහසු පුද්ගලයන් කණ්ඩායමක් වේ.එමෙන්ම පොලිසිය අදාළ රජයේ සේවා සපයන බොහෝ ආයතනවලින් හිරිහැර කිරීම්වලට සහ සමච්චලයට භාජනය වෙන මෙම ප්‍රජාවට සමාජය තුළ කිසිදු වරප්‍රසාදයක් නොමැත.

# 02. LGBTIQ+ ප්‍රජාව පිළිබඳ ඓතිහාසික හා සංස්කෘතික සන්දර්භය.

LGBTIQ+ ප්‍රජාව පිළිබඳ සමාජය තුළ මුල් බැසගෙන තිබෙන මිත්‍යා අදහසක් තමයි මෙම ප්‍රජාව පිළිබඳ අදහස බටහිරින් ආපු දෙයක් කියන එක බටහිර සංකල්පයක් ශ්‍රී ලංකා සමාජයට අරගෙන ඇවිල්ලා අපේ සංස්කෘතිය සහ සදාචාරය විනාශ කරන්න හදනවා කියන එක. මේක මිත්‍යා මතයට එරෙහිව ඓතිහාසික සාධක උල්ලංඝනය කිරීමක්.

ශ්‍රී ලංකාව එහෙමත් නැත්නම් හෙළදිවයින, තම්බපන්නිය, ලංකා, සෙයිලෝන්, සිලෝන් නමින් හැඳින්වේ.දිවයින පෘතුගීසින්, ලංදේසීන් හා ඉංග්‍රීසින්ට යටත් විජිතයක්ව පැවතීමට පෙර නිදහස් සහ විවෘත ලිංගික සම්බන්ධතා පැවති රටක් බවට ලිඛිත සාක්ෂි ඕනෑ තරම් තිබේ."එකගෙයි කෑම", "බින්න විවාහය", "බහුපුරුෂ විවාහය", "බහු ස්ත්‍රී විවාහය ", "යකඩ දෝලින් පාවාදීම", "අමුතු බත් කෑම", "නවාතැන් හිර සැපයීම" යනාදී, විවිධ සංස්කෘතික හා සමාජීය පිළිවෙත් සහ සම්ප්‍රදායන් වලින් කියවෙන්නෙ අපි කොතරම් නම් නිදහස් සහ ලිංගිකත්වය විවෘත සමාජයක් තුළ සහ පවත්වාගෙන ගිය ජාතියක් ද යන්නයි.

සමරිසි සම්බන්ධතා පිළිබඳ ඉතිහාස ගත මූලාශ්‍ර විශාල ප්‍රමාණයක් හමුවේ. නාලන්දාගෙඩිගේ සුප්‍රසිද්ධ ගල්කැටයම් මඟින් සමරිසි පුද්ගලයන්ගේ ලිංගික සම්බන්ධතා නිරූපණය කෙරෙන අතර මධ්‍යතන යුගයේ ආගමික ස්ථානයක එවැනි කැටයමක් කිරීමට අනුබලය ලැබීමට

ලිංගික සම්බන්ධතා පිළිබඳ පැවති නිදහස් මානසිකත්වය පෙන්නුම් කරයි.

විනය පිටකයේ භික්ෂූන් වහන්සේලාට සමරිසි සම්බන්ධතා පැවැත්වීම විනය විරෝධී බව දක්වා තිබුණද එය ගිහි පුද්ගලයින් සම්බන්ධයෙන් සඳහන් කර නොමැත. එමෙන්ම ඒවා සඳහන් කර ඇත්තේ භික්ෂූන් වහන්සේලාගේ හැසිරීම ආරක්ෂා කිරීම සඳහා මිස නීතියෙන් හෝ වෛරයෙන් බැලීමක් ලෙස නොවේ. එහෙත් විනය පිටකයේ මෙය සඳහන් වීම අතීතයේ දී සමාජය තුළ සමරිසි සම්බන්ධතා පැවති බවට උදාහරණ සපයයි.

පහතරට ශාන්තිකර්ම හා කෝලම් හා නාඩගම්වල සංක්‍රාන්ති සමාජභාවීය හා හරස් විලාසිතා සිදුකරනු ලබන චරිත ඇතුලත් රංගනයන් පැවති අතර වර්තමානයේදීත් ස්ත්‍රී චරිත රඟ දක්වන පුරුෂයන් හා ඔවුන්ගේ නාරිදේහ ලක්ෂණ පිළිබඳව මධ්‍යස්ථ අදහසක් සමාජය තුළ පවතින බව දැකිය හැකිය.

1547 නොවැම්බර් 27 දින සිලෝන්හි සිට පෘතුගීසි සේවායෙකු විසින් ගෝවේ සිටි ඩී.ජොවාවෝ ද කස්කෝ නම් උප පාලකයාට යැවූ ලිපියක පහත පරිදි සඳහන් වී ඇත.

"සමලිංගික අය කෝට්ටේ රාජධානිය පුරා පැතිර ඇති අතර මෙහි ජීවත්වීම ගැන අපට දැනෙන්නේ බයකි.රාජධානියේ වෙසෙන වැදගත් නායකයෙකු වෙත ගොස් මෙවැනි අශිෂ්ඨ ක්‍රියාවක් ගැන ලැජ්ජා නොවෙන්නේ ඇයි හසු කළ පසු පිළිතුරු දුන්නේ රජතුමා විසින් යමක්

කරන්නේ නම් එය අපගේ චාරිත්‍රය වන බවයි." මේ vii වන බුවනෙකබාහු රජතුමා ගැන එවකට පළමු අදහසයි.

සිලෝන් දූප්පත් සිරකරුවකුව සිටි රොබට් නොක්ස් 1681දී පළ කරන ලද "සිලෝන් දූපතේ ඓතිහාසික සම්බන්ධතා" කෘතියට අනුව සමලිංගිකත්වය හඳුන්වා ඇත්තේ "සොදොම් වැරදි" නමිනි.

"රජතුමාගේ බොහෝ සේවකයන් වූයේ කොල්ලන්ය. තරුණ පිරිමින්ය. හොඳ පවුල් වලින් එන කඩවසම් අයය.දිසාවේලා හෝ රටේ මහත්වරු හරහා එවැනි කොලු ගැටන් තෝරා ගැනෙන අතර යහපත් පෙනුමක්,හොඳ පවුල් පසුබිමක් සහිත අය තෝරා මාලිගාවට එවයි.මේ කොලුවන්ගේ බූ ගාන අතර පිටුපසින් එල්ලා වැටෙන පරිදි කෙස් ස්වල්පයක් ඉතුරු කරයි. රජුට සමලිංගික හැසිරීම් සම්බන්ධයෙන් වරදක් නොදැනුනු අතර ඔවුන් අතර එවැනි දේ ගැන කතා වෙනුද ඔබ කිසිදිනෙක නොඇසුවෙමි. රොබට් නොක්ස් මේ ලියන්නේ දෙවන රාජසිංහ රජතුමා පිළිබඳවයි.

ඉහත මූලාශ්‍ර දෙකම "සොදොම්" වැරදි පිළිබඳ අදහස් හුවා දක්වන්නේ මෙම කාලසීමාවේදී. එංගලන්තය හා පෘතුගාලය ඉතා දාසිලෙස ක්‍රිස්තියානි ආගම මත පදනම්ව සමරිසිභාවය ලෙස සලකා තිබූ බැවිනි. එහෙත් දැන් එම රටවල් දෙකේම සමරිසි පුද්ගලයන්ට එරෙහිව පැවති නීති වෙනස් කර ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කර තිබේ. නිදහස් ලිංගික සම්බන්ධතා පැවති අපගේ රටවල් ඔවුන් විසින් පවරා දුන් නීති මත තවමත් කටයුතු කරමින් සිටී.

ඓතිහාසික හින්දු ග්‍රන්ථ දෙකක් වන "මනුස්මෘතිය" සහ "කාම සූත්‍ර" යන දෙකෙහිම දැක්වෙන සමාජභාවයත් (ත්‍රිනිය ප්‍රතීති) නැතහොත් සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන් පිළිබඳව හඳුනාගෙන තිබේ.ඉන්දියාවේ,නේපාලයේ සහ පාකිස්ථානයේ ජීවත්වෙන "හිජ්‍රා" යන සුළුතර ලිංගික කණ්ඩායම හින්දු සංස්කෘතිය තුළ පැවත එන ආගමික හා සමාජයිය යන කාර්යභාරයන් දෙකෙහිම විශාල අවධානයක් දිනා ගනී.

"අර්ධ නාරිශ්වර" සංකල්පය තුළින් (ශ්‍රී ලංකාවේද අර්ධ නාරිශ්වර කැටයම් හොයාගෙන ඇත.) ශිව සහ පාර්වතී යන දෙදෙනාගේම සංකලනය ඉදිරිපත් කෙරෙන අතර අර්ධ නාරිශ්වර යනු පුරුෂත්වය සහ ස්ත්‍රීත්වය යන දෙකම දේවමය රූපයක් පෙන්නුම් කරන සංකේතයයි. සංස්කෘත කෘතියක් වන "කාම සූත්‍ර" හි සමාන ලිංගිකයින් අතර ඇතිවන ආදරය හා ලිංගික සම්බන්ධතා පිළිබඳ පරිච්ඡේදයක් එකතු කර ඇත.

හින්දු දර්ශනයෙහි එන "ස්කන්ධ පුරාණය" කෘතියට අනුව භාගිරක රජතුමා කාන්තාවන් දෙදෙනෙකුගේ එකතුවීම නිසා උපත ලැබූ කෙනෙකු බව සඳහන් වෙනවා. එමෙන්ම හින්දු දර්ශනයෙහි එන "භක්ති" කවිවල අර්ජුන සහ ක්‍රිෂ්ණා දෙවියන් අතර පැවති ආදර සම්බන්ධතා වයක් දක්වා තිබේ.සමහර කතාන්දර වලට අනුව ක්‍රිෂ්නා යනු කාන්තාමය ගති ලක්ෂණ ප්‍රකට කළ පුරුෂයන් හා කාන්තාවන් යන දෙපාර්ශවයම ඇසුරු කළ ද්විරිසි පුද්ගලයෙකු ලෙස දක්වා තිබේ. දකුණු ඉන්දිය සංස්කෘතිය තුළ හිජ්‍රා වරුන් විවාහ මංගල්‍යය සහ දරුවන් උපත ලැබූ අවස්ථාවලදී ආශිර්වාද ලබාගැනීම සඳහා නිවසට කැඳවා

තිබේ. එමෙන්ම හිජ්‍රා පුද්ගලයෙකු ලෙස සැලකෙන "අරවාන්" පිදීම සඳහා තමිල්නාඩුවේ "තෝවගම් උත්සවය" නමින් සංස්කෘතික උත්සවයක්ද පවත්වයි.

කතෝලික සහ ක්‍රිස්තියානි ආගම්වල තවමත් LGBTIQ+ ප්‍රජාව පිළිබඳ සාකච්ඡා වෙමින් පවතින අතර රෝමානු කතෝලික ආගම ක්‍රම ක්‍රමයෙන් LGBTIQ+ ප්‍රජාව කෙරෙහි හිතකර ආකල්පයක් දරනු පෙනේ.ඔවුන්ට අනුව LGBTIQ+ ප්‍රජාව ගරුත්වයෙන් සහ සංවේදීභාවයෙන් සැලකිය යුතු ප්‍රජාවකි.විශේෂයෙන් ෆ්‍රැන්සිස් පාප් වහන්සේ 2013 වර්ෂයේ දී ප්‍රසිද්ධ ප්‍රකාශ කරමින් සිටියේ "කිසියම් පුද්ගලයෙකු සමරිසි වී ඉපදීම දෙවියන් වහන්සේගේ කැමැත්ත නම් එය විනිශ්චය කිරීමට මම කවුරුන්ද?" යනුවෙනි.
2023 වර්ෂයේදී ෆ්‍රැන්සිස් පාප් වහන්සේ කියා සිටියේ "LGBTIQ+" ප්‍රජාවද දෙවියන්ගේ ආශිර්වාදය ලබාගැනීමට සුදුසු පුද්ගලයන් වන බවයි.

# 03. LGBTIQ+ ප්‍රජාවේ ජීවන යථාර්ථය.

1883 වර්ෂයේදී එවකට සිලෝන් ලෙස හැඳින්වූ ශ්‍රී ලංකාවට දණ්ඩ නීති සංග්‍රහය හඳුන්වා දෙන්නේ බ්‍රිතානය ජාතිකයින් විසිනි. ශ්‍රී ලංකාව එවකට බ්‍රිතානය යටත් විජිතයක්ව පැවති නිසා 1860 දී ඉන්දියාවට හඳුන්වා දුන් දණ්ඩ නීති සංග්‍රහයට සිලෝන් නමින් හැඳින්වූ අපේ රටටද ලබා දෙන ලදී. මෙම දණ්ඩ නීති සංග්‍රහය ලියන ලද්දේ තෝමස් මැකලේ (Thomas Macaulay) නම් දැඩි ආගමික මතධාරි සාමිවරයෙකු විසිනි.

මෙම දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365 අ යන වගන්ති මඟින් සමරිසි සම්බන්ධතා දඬුවම් ලැබිය හැකි වරදක් ලෙස සලකනු ලබයි.එම වගන්ති වල කුමනාකාරයේ සමරිසි සම්බන්ධතා වැරදිද, එම වැරදි හඳුනාගන්නේ කෙසේද යනුවෙන් නිරිවචනාත්මක දෝෂ පවතින නමුත් තවමත් පොලිසිය විසින් සමරිසි පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට මෙම වගන්ති භාවිතා කරයි. එම වගන්ති වල එන,

I. ස්වභාව ධර්මයට පටහැනි තදබල කාමුක සංසර්ගය.
II. තැනැත්තන් අතර දැඩි අශිෂ්ඨ ක්‍රියා.

යන අදහස් නිසි නිර්වචනයන් ඉදිරිපත් කර නොමැති නිසා ශ්‍රී ලංකාවේ ජීවත් වෙන LGBTIQ+ ප්‍රජාව නිතිය ඉදිරියේ සහ සමාජය තුළදී දැඩි අපහසුතාවයට ලක්වේ.මෙම නීති හඳුන්වා දුන් බ්‍රිතානය ජාතිකයින් පවා ඔවුන්ගේ නීති සංශෝධනය කර සමරිසි පුද්ගලයන්ට විවාහ වීමට පවා අයිතිවාසිකම් ලබාදී තිබේ.

දණ්ඩ නීති සංග්‍රහයේ 365 / 365(අ) වගන්ති හා සමානව තිබුණු ඉන්දියාවේ දණ්ඩ නීති සංග්‍රහයේ 377 වගන්ති ද සංශෝධනය වූ අතර ඉන්දියාවේ සමරිසි සම්බන්ධතා අපරාධමය වරදක් ලෙස සලකන්නේ නැත.

මීට අමතරව පාදඩ ආඥාපනත සහ දණ්ඩ නීති සංග්‍රහයේ 399 වගන්තිය වන,
"වෙනස් පුද්ගලයෙකු ලෙස පෙනී සිටිමින් රැවටීමට තැත් කිරීම" යන නීති සංක්‍රාන්ති සමාජභාවීය ප්‍රජාව, නච්චි ප්‍රජාව සහ ඇන්ඩ්‍රොජනීස් ප්‍රජාව අත් අඩංගුවට ගැනීමට සහ පොලිස් අත් අඩංගුවේ රඳවා තබාගැනීමට යොදාගනු දැකිය හැකිය.
දණ්ඩ නීති සංග්‍රහයේ 365 වගන්තිය සංශෝධනය කිරීමටත් 365 (අ) වගන්තිය ඉවත් කිරීමටත් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2023 වර්ෂයේදී පාර්ලිමේන්තුවට අවසර ලබා දුන්නද තවමත් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන නොමැත.

# 04. ශ්‍රී ලංකාවේ ජීවත් වන LGBTIQ+ ප්‍රජාව මුහුණ දෙන පොදු අභියෝග

- **සමාජ අපකීර්තිය.**

කිසියම් පුද්ගලයෙකු සමරිසි වීම හෝ සංක්‍රාන්ති සමාජභාවීය වීම නැතහොත් වෙනත් සමාජභාවීය අනන්‍යතාවයන් දැරීම ශ්‍රී ලංකාවේ සමාජ සන්දර්භය තුළ එම පුද්ගලයා දැඩි අපකීර්තියට ලක්විය හැකි තත්ත්වයකි.මෙම පුද්ගලයින් අපහාසයට ලක් කිරීමට සමාජය තුළ විවිධ අසභ්‍ය සහ ලැජ්ජා සහගත වචන නිර්මාණය වී ඇති අතර ඒවා මඟින් මෙම පුද්ගලයන් වාචිකව,මානසිකව මෙන්ම බොහෝ අවස්ථා වලදී ශාරීරික වශයෙන් ද හිංසනයට ලක් කිරීමට පෙළෙඹෙනු දැකිය හැකිය.

- **පවුලෙන් කොන්වීම.**

ශ්‍රී ලංකාවේ පවුල් සංස්ථාව නිර්මාණය වී ඇති ආකාරය සහ පවුල තුළ කාර්යභාරයන් හා භූමිකා බෙදී යාම LGBTIQ+ දරුවෙකුට සුබවාදී නොවේ.

පරම්පරාව ගෙන යාම, වාසගම, දේපළ සමාජ ගරුත්වය හා නම්බුව, සමාජය තුළ පිළිගැනීම, පවුලේ අනෙක් දරුවන්ගේ අධ්‍යාපනය සහ අනාගතය යනාදී බොහෝ සාධක මත පවුලක් මඟින් අපේක්ෂා කරන්නේ විෂම ලිංගික සහ ස්ත්‍රීතික සමාජභාවීය දරුවෙකි.එහෙත් ජානමය හේතු හෝ වෙනත් මනෝ විද්‍යාත්මක හේතු මත පදනම්ව වුවද

තමන්ගේ පවුලේ සමරිසි හෝ සංක්‍රාන්ති සමාජභාවීය දරුවෙකු නැතහොත් අන්තර්ලිංගික ළමයෙකු සිටීම විශාල අපරාධයක් සහ අපකීර්තියක් ලෙස දෙමාපියන් දකී.මේ නිසා LGBTIQ+ දරුවන් පවුල තුළ විශාල කොන්වීමට ලක්වේ.

නිරන්තරව පහරදුම, බැණ වැදීම්, අවලාද කීම්, දේපළ ලබානොදීම, පවුලේ ප්‍රියසම්භාෂණ යනාදියෙන් ඉවත් කිරීම නිවසෙන් එළියට යාමට බල කිරීම පමණක් නොව විවිධ ප්‍රතිකාරවලට බලහත්කාරයෙන් යොමු කරවීම, තොවිල් වැනි යාතුකර්ම සිදුකිරීමද දැකිය හැකිය. එමෙන්ම බලහත්කාරයෙන් විවාහ කරදීම සහ විවිධාකාරයෙන් මානසික පීඩනයට ලක් කිරීමද සිදුවේ.

පවුලෙන් පීඩාවට සහ හිංසනයට ලක්වන LGBTIQ+ දරුවන් ඒ පිළිබඳ පොලිසියට හෝ වෙනත් ස්ථානයකට පැමිණිලි කරන්නේ ද නැත. ශ්‍රී ලංකාවේ එලෙස පැමිණිලි කිරීමෙන් පසු සාධාරණයක් ඉටු කරගත හැකිවේයැයි යන විශ්වාසයද LGBTIQ+ දරුවන්ට නොමැත. පවුලෙන් කොන්වීම සහ විවිධ හිරිහැර වලට ලක්වෙන LGBTIQ+ දරුවන් බොහෝ දෙනෙකු දීර්ඝ කාලයක් තිස්සේ මානසික රෝගවලින් පීඩාවට පත්වන අතර සමහර අය සියදිවි නසාගැනීමට උත්සාහ කර ඇත. අවාසනාවට තමන්ගේ ම පවුලේ අයගෙන් දූෂණය වූ සහ අපහරණයට ලක් වූ LGBTIQ+ දරුවන් ද අප ආයතනයට දැනගැනීමට ලැබී ඇත. මේ නිසා සේවා සපයන කෙනෙකු වශයෙන් ඔබ LGBTIQ+ පුද්ගලයෙකු කෙරෙහි සංවේදී වීම අත්‍යවශ්‍ය වන්නේ ඔවුන්ට ජීවිත කාලය පුරාම පවුලෙන් එළඹෙන විවිධ අභියෝග සමඟ අරගල කරන අහිංසක පිරිසක් වන බැවිනි.

- **අධ්‍යාපන ආයතන තුළ සිදුවන වෙනස්කොට සැලකීම්.**

පවුල් සංස්ථාව මෙන්ම සමාජ අගයයන්, සංස්කෘතිය, භූමිකා, ලිංගික හා සමාජභාවීය අගයයන් පවරා දෙනු ලබන සහ ප්‍රවර්ධනය කරන ප්‍රධානතම ආයතනය පාසලයි.ශ්‍රී ලංකාව තුළ පරිපූර්ණ ලිංගික අධ්‍යාපනය නොමැති නිසා ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය හා අයිතිවාසිකම් සම්බන්ධයෙන් දැනුම ලබාගැනීමට පාසල් දරුවන්ට අවස්ථා නොමැති අතර ඒ නිසාම විවිධ ලිංගික අනන්‍යතා සහිත පුද්ගලයන් සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු සහ දැනුම ඔවුන්ට ලැබෙන්නේ නැත.එමෙන්ම පාසල සාම්ප්‍රදායික ස්ත්‍රී සහ පුරුෂ සම්මතයන් ප්‍රවර්ධනය කරන ස්ථානයක් නිසා කිසියම් ශිෂ්‍යයෙකු සමරිසි හෝ සංක්‍රාන්ති සමාජභාවීය හෝ වෙනත් අනන්‍යතා සහිත දරුවෙකු වුවහොත් අනෙකුත් ශිෂ්‍යයන්ගේ,ගුරුවරුන්ගේ සහ දෙමාපියන්ගෙන් විවිධ හිරිහැරවලට සහ වෙනස්කොට සැලකීමට භාජනය වීමට නිනැතින් සිදුවේ.මේ නිසා පාසල් පද්ධතිය තුළ සිටින LGBTIQ+ ශිෂ්‍යයන්ගේ ඉගෙනුම් ප්‍රගතිය සහ ලකුණු අඩුවීම් හැකි අතරම මානසිකව කඩා වැටීමට ලක්විය හැකිය.

ඉක්විටි ආයතනය 2023 වර්ෂයේදී සිදුකරනු ලැබූ අධ්‍යනයකට අනුව අධ්‍යනයට සහභාගි වූ LGBTIQ+ පුද්ගලයින්ගෙන් 54%ක්ම ප්‍රකාශ කර තිබුණේ ඔවුන්ට අධ්‍යාපනික ආයතන වලින් සමාන ඉගැනුම් ලැබීමේ අයිතිය නොලැබුන බවයි.එම අධ්‍යනයට සහභාගි වූ LGBTIQ+ ප්‍රජාවේ අයගෙන් 22%ක්ම අතරමැදදි තමන්ගේ අධ්‍යාපනය නවතා දමා තිබූ අතර පාසල් හැර දා ගොස් තිබුණි. 70%කට වැඩි ප්‍රමාණයක් ප්‍රකාශ කර

තිබුණේ ඔවුන්ගේ සමාජභාවීය අනන්‍යතාව හෝ ලිංගික දිශානතිය මත පදනම්ව හිංසාවට ලක්ව ඇති බවයි.

- **සෞඛ්‍ය සේවා සපයන ආයතනවල අසමාන ලෙස සැලකීම.**

LGBTIQ+ ප්‍රජාව අසමාන ලෙස සලකන රාජ්‍ය ආයතන අතර ප්‍රමුඛස්ථානයක් ගන්නෙ රජයේ රෝහලයි. පුද්ගලයින්ගේ බාහිර පෙනුම, කතාබහ කරන ආකාරය,ඇවිදින ආකාරය මත පදනම්ව බොහෝ LGBTIQ+ පුද්ගලයන් සෞඛ්‍ය සේවා සපයන ආයතනවල වාචික හිරිහැර වලට ලක්වීම දැකිය හැකිය. නොසලකා හැරීම සහ රස්තියාදු කිරීම මේ අතර ප්‍රමුඛ වේ.

මෙම සිදුවීම්වලට ගොදුරු වන්නේ සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන්, ද්වීමය නොවන සමාජභාවය සහිත පුද්ගලයන් හා නච්චි ප්‍රජාවේ අයයි. විශේෂයෙන් GRC එක ලබාගැනීම සඳහා මාස්පතා මානසික සෞඛ්‍ය සායනයට යන සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන්ව රෝහල් සුළු සේවකයින්, හෙද නිලධාරීන්ගේ වාචික හිංසන සහ අපහසවලට ලක්වීමට සිදුවීම සුලබ කරුණකි.

ඊට අමතරව පුද්ගල අනන්‍යතාව වෙනත් පුද්ගලයන්ට නිරාවරණය කිරීමද සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ ප්‍රමුඛ කරුණකි. සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන්ගේ හෝමෝන ලබා ගැනීම සහ සැත්කම් සිදුකිරීම යනාදිය ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ තවමත් ප්‍රමුඛතාවයක් නොවන නිසා වෛද්‍ය සංක්‍රාන්ති ක්‍රියාවලියට රෝහල් ගතවන බොහෝ සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින් රස්තියාදු වීම හා ඔවුන්ගේ සැත්කම් නවතා දැමීම සහ කල් දැමීම නිරන්තරයෙන් සිදුවේ.

## 05. LGBTIQ+ ප්‍රජාව ගැන තිබෙන පොදු මිත්‍යාවන් ගැන ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය පැහැදිලි කරලා තියෙන්නෙ කොහොමද?

**2023 අප්‍රේල් මස 4 වන දින** ගරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ **දණ්ඩ නීති සංශෝධන පනත් කෙටුම්පතට** ගරු ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් නඩු තීන්දුව ඉතා විශේෂ තීන්දුවකි. දණ්ඩ නීති සංග්‍රහයේ 365 වගන්තිය සංශෝධනය කිරීමට සහ 365අ වගන්තිය ඉවත් කිරීමට ගෙන ආ දණ්ඩ නීති සංශෝධන යෝජනාවට එරෙහිව පෙත්සම් කරුවන් කිහිපදෙනෙකු විසින් මෙම යෝජනාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බව පවසමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙත්සමක් ගොනු කරන ලදී. එම අවස්ථාවේදී එම පෙත්සමට ද විරුද්ධව LGBTIQ+ ප්‍රජා සංවිධාන, අයිතිවාසිකම් ක්‍රියාකාරීන්, නීතිඥවරුන්, වෛද්‍යවරුන්, මහාචාර්යවරුන් හා විවිධ ක්ෂේත්‍ර වල විශේෂඥයන් විසින් අතුරු පෙත්සම් රාශියක් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලදී.

එම පෙත්සමේ පළමුවන තර්කය වූයේ 365 සහ 365අ වගන්ති තුළ දක්වා ඇති ළමුන් සහ වයස අවුරුදු 16ට වඩා අඩු තැනැත්තන්ගේ ආරක්ෂාව සඳහා සපයා දී ඇති රැකවරණයන්, පනත් කෙටුම්පත මගින් යෝජනා කොට ඇති සංශෝධනයන් විසින් නැති කරන බවත් එමගින් ළමුන් සූරාකෑම සඳහා ඉඩකඩ සලසමින් ළමුන්ට එරෙහි වැරදි හා සම්බන්ධයෙන් නීතිය තුළ හිඩැසක් ඉතිරි කරන බවත්ය.

එම තර්කය සඳහා පිළිතුරු ලෙස 1995 වසරේදී දණ්ඩ නීති සංග්‍රහයට හඳුන්වා දෙන ලද සංශෝධනයන්ගේ කේන්ද්‍රය වූයේ කාන්තාවන් සහ ළමුන් බවත්, එක් පාර්ශවයක් වයස අවුරුදු 16 ට අඩු වන විට දඬුවම ඉහළ දැමීම සඳහා 365 සහ 365අ වගන්ති විසින් 'බරපතල ලිංගික අපයොජනය' නම් වරදක් හඳුන්වා දෙන ලද බවත් උගත් අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ හරිප්‍රියා ජයසුන්දර ප්‍රකාශ කළාය. 1998 අංක 29 දරණ දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන)පනත විසින් හඳුන්වා දෙන ලද 365ආ වගන්තියට අනුව වයස අවුරුදු 16ට අඩු ළමයෙකු සම්බන්ධයෙන් බරපතල ලිංගික අපයෝජනය නම් වරද සංස්ථාපනය කරනු ලබන අතර කවර හෝ ලිංගික කටයුත්තක් සිදුවන අවස්ථාවකදී කැමැත්ත අදාළ නොවන බව උගත් අතිරේක සොලිසිටර් ජනරාල්වරයා තවදුරටත් ප්‍රකාශ කළාය. -365ආ(1)(අඅ) වගන්තිය බලන්න. යම් පුද්ගලයෙකුගේ ක්‍රියාවක් 365ආ වගන්තිය තුළ දක්වා ඇති නිර්වචනය යටතට ගත නොහැකි විටදී වාචිකව හෝ ක්‍රියාවන් තුළින් සිදු කරනු ලබන කවර හෝ පිළිගත නොහැකි ලිංගික ඉඟියක් වෙතින් ළමුන් ආරක්ෂා කිරීම සඳහා ලිංගික හිංසනය සම්බන්ධයෙන් විධිවිධාන සපයනු ලබන දණ්ඩ නීති සංග්‍රහයේ 345 වගන්තිය භාවිතා කළ හැකි බව ඇයගේ මතය විය. ඒ අනුව පෙත්සම්කරුවන්ගේ තර්කය පදනම් විරහිත හා කිසිදු නෛතික පසුබිමක් රහිත එකක් යනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවේ සඳහන් වේ.

පෙත්සම්කරුවන් වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරයාගේ දෙවන තර්කය වූයේ 365 සහ 365අ වගන්ති සංශෝධන විසින් නීතියේ

ආධිපත්‍ය අඩු කොට පුරවැසියන්ගේ ජීවිත සහ නිදහස අනතුරේ හෙලන බවයි. මෙම තර්කය වඩාත් දුර්වල එකක් වන අතර පෙත්සම්කරුවන් විසින් මෙම පනත් කෙටුම්පත සම්මත වීම සහ නීතියේ ආධිපත්‍ය උල්ලංඝනය වීම අතර ඇති සහ-සම්බන්ධය පෙන්වීමට සමත් වූයේ නැත.

තෙවන තර්කය වූයේ HIV සහ ඒඩ්ස් ආසාදිත වූ පුද්ගලයන් බහුතරයක් හට පුරුෂ හෝ ද්විරිසි කටයුතු වලට නිරාවරණය වීමේ ඉතිහාසයක් ඇති බවත් සමරිසි පුද්ගලයින් අතර සිදුවන ලිංගික සබඳතා හේතුවෙන් HIV සහ ඒඩ්ස් ආසාදනය වන පුද්ගලයන්ගේ සංඛ්‍යාව ඉහළ යා හැකි බවත් ය. මෙමගින් පුද්ගලයින්, පවුල්, ප්‍රජාවන් සහ සමාජ ආර්ථික ආයතන මෙන්ම හමුදා සහ පොලිස් බලකා විනාශ කරමින් ජාතික ආරක්ෂාවට බරපතල බලපෑමක් එල්ල විය හැකි බවත් ශ්‍රී ලාංකික පුරවැසියෙකු හට සිය පැවැත්ම සඳහා වූ පූර්ණ විභවතාවයන් සාක්ෂාත් කරගැනීමට උපකාරී වන ආරක්ෂිත පරිසරයක් තහවුරු කරනු ලබන විධිවිධාන නොමැතිව මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදය මගින් සහතික කොට දී ඇති ආරක්ෂාව සැබෑ ලෙස බුක්ති විඳිය නොහැකි බව වැඩිදුර කරුණු දක්වමින් ප්‍රකාශ කරන ලදී.

අතරමැදි පෙත්සම්කරුවන් වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥයින් වන පුලස්ති හේවාමාන්න මහතා, අර්මිසා ටීගල් මිය, එන්.කේ අශෝක්භරන් මහතා විසින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සකසන ලද "ශ්‍රී ලංකාව සඳහා ජාතික HIV / ලිංගාශ්‍රිත රෝග පිළිබඳ මූලෝපායික සැළසුම (2018-

2022) සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ පොදු රාජ්‍ය මණ්ඩලීය විද්වත් කණ්ඩායම විසින් සකස් කරන ලද වාර්තා මත පදනම් වෙමින් එම තර්කය ට එරෙහිව වැදගත් තර්ක තුනක් ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව, HIV සම්ප්‍රේෂණය වන පුද්ගලයින් වන්නේ සමරිසි පුරුෂයින් පමණක් නොවන අතර, කාන්තා ලිංගික ශ්‍රමිකයන්, නැවත සිය රට ට පැමිණෙන සංක්‍රමණික ශ්‍රමිකයන් සහ එන්නත් මගින් මත්ද්‍රව්‍ය ශරීරගත කරගන්නා පුද්ගලයන් ද HIV වැළඳීමේ අවදානම දරණු ලබයි. ඉදිරිපත් කළ දෙවන කරුණ වන්නේ, සිය කැමැත්තෙන් සමලිංගික කටයුතු වල නියැළෙන වැඩිහිටි පුරුෂයන් දෙදෙනෙකු අපරාධකරුවන් ලෙස සැළකීම මගින් එම පුද්ගලයන් සමාජයෙන් කොන් වීමට ලක් වන අතර ඔවුන් හට HIV ඒඩ්ස් වැළඳුනද ප්‍රතිකාර වෙත ඇති ප්‍රවේශය අහිමි වන බවයි. තෙවන කරුණ වන්නේ, එළෙස ආසාදනය වීමට ඉහළ අවදානමක් සහිත පුද්ගලයින් සහ කණ්ඩායම් වෙත ප්‍රවේශ වීමට 365 සහ 365අ වගන්ති සශෝධන මගින් පහසුවෙන් ඉඩ සලසා ගත හැකි වීමයි.

365 සහ 365අ වගන්ති HIV සහ ඒඩ්ස් වසංගතයකට ඉඩ සලසන බවත් එම වගන්ති පරිච්ඡින්න කළහොත් ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා සහ පොලිසිය එච් අයි වී සහ ඒඩ්ස් වසංගතය විසින් විනාශ කොට දමනු ඇතිය යන්නත් ප්‍රඥාගෝචර නොවන කරුණක් වන අතර සිය තර්කය සනාථ කිරීම සඳහා පෙත්සම්කරුවන් විසින් විද්‍යාත්මකව පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් නොකිරීම ද විමතියට කරුණක් නොවන බවත් ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ අදහස විය.

ශ්‍රේෂ්ඨාධිකරණයේදී ඉදිරිපත් කළ සිව්වන තර්කය වූයේ සමරිසි ක්‍රියාකාරකම් බෞද්ධාගමේ මූලධර්ම වලට පටහැනි බවත්, ඒ අනුව එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන වගන්තිය උල්ලංඝනය කරන බවයි. එහි "ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේය, එහෙයින්, 10 වන ව්‍යවස්ථාවෙන් සහ 14 වන ව්‍යවස්ථාවෙන් සහ 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ (ඉ) ඡේදයෙන් සියලුම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන අතර බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේය" යනුවෙන් ඉදිරිපත් කරන ලදි.

කෙනෙකුගේ ලිංගික දිශානතිය නිර්සාපරාධීකරණය කිරීම බුද්ධ ශාසනය ආරක්ෂා කොට ප්‍රවර්ධනය කිරීමේ රාජ්‍යයේ යුතුකම අවඥාවට ලක් කරන්නේ කෙසේද හෝ බෞද්ධ භික්ෂුවක් වෙනත් පුද්ගලයෙකු සමග ලිංගික සම්බන්ධතා පැවැත්වීම (පාරාජිකා), අනෙක් පුද්ගලයා එම ලිංගිකත්වයටම අයත් ද වෙනත් ලිංගිකත්වයකට අයත්ද යන්න සැළකීමෙන් තොරව වරදක් ලෙස සැළකීම හැර යෝජිත සංශෝධන බුද්ධ ශාසනයට පටහැනි වන්නේ කෙසේදැයි පෙත්සම්කරුවන් විසින් පැහැදිලි කොට නොමැත.

පෙත්සම්කරුවන් විසින් හා ඔවුන්ගේ සහායට ඉදිරිපත් කරන ලද බොහෝ තර්ක අතර යම් පොදු සාධකයක් දක්නට ලැබෙන අතර ඒ නම්, ඒවා විශාල ලෙස අනුමානයන් මත පදනම් වන බවයි. එහෙයින් ඒවා සංක්ෂේපණීය ලෙස නිෂ්ප්‍රභා කරනු ලැබිය හැකිය. උදාහරණයක් ලෙස

මෙම පනත සම්මත කිරීම මගින් ළමුන්ට හානි සිදු වේය යන තර්කය හෝ HIV සහ ඒඩ්ස් ආසාදනය වන පුද්ගලයින් සංඛ්‍යාව ඉහළ යා හැකිය යන්න නොමග යවන සුලුය. හඳුන්වාදීමට අපේක්ෂා කරනු ලබන සංශෝධන සහ පනත් කෙටුම්පත සම්මත වුවහොත් මතු වේ යැයි පෙත්සම්කරුවන් විසින් කියා සිටින ලද කරුණු අනුමානයෙන් යුතුව ඉදිරිපත් කරන ලද මනඃකල්පිත හා බැලූබැල්මට සාවද්‍ය කරුණු බව එක හඬින් ප්‍රකාශ කිරීමට තුඩු දුන් අතර ඉහත ආකාරයට තර්ක කිරීමට මගින් සමාජයේ එක් කොටසකට නීතියේ සම ආරක්ෂාව අහිමි කරමින් සිටිනු ලබන බව තර්ක කරන ලදී. මෙම කරුණ මෙම ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මින් පෙර තීන්දු කිහිපයකදී සළකා බලා තිබේ.

**මෙම පෙත්සම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව** වූයේ සමස්තයක් ලෙස 365 සහ 365අ වගන්ති සංශෝධන පනත් කෙටුම්පත හෝ එහි කවර හෝ ප්‍රතිපාදනයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි නොවන බව ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය යන්නයි.

# 06. පොලිස් නිලධාරීන් ඇතුළු සේවා සපයන පාර්ශ්වකරුවන්ගෙන් LGBTIQ+ ප්‍රජාව මොනවද බලාපොරොත්තු වෙන්නෙ?

LGBTIQ+ ප්‍රජාව, නැතහොත් විවිධ අනන්‍යතා ඇති ප්‍රජාව ලංකාවේ නීත්‍යානුකූල පුරවැසියන් වේ. ඡන්ද අයිතිය හිමි, බදු මුදල් ගෙවන, රටේ ශ්‍රම බලකායට දායක වන ශ්‍රී ලාංකිකයන් වේ. එබැවින් සියලුම පුරවැසියන්ට හිමි නීතිමය ආරක්ෂාව ද එම පුද්ගලයන්ට සමානව ලැබීමේ අයිතිය, නීතිය ඉදිරියේ සමාන බව සහ යුක්තිය අපේක්ෂා කරයි.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා පොලිසිය වෙත නිකුත් කළ මාර්ගෝපදේශ මාලාව අනුව, අන්තර්ජාතික මනෝවිද්‍යාඥයින්ගේ සංගමය, ලෝක සෞඛ්‍ය සංවිධානය වැනි වෛද්‍ය සංවිධාන සහ වෘත්තිකයන් මෙය රෝග තත්ත්වයක් නොවන බව ඔප්පු කර ඇත. මෙම ආන්තික කණ්ඩායම් මානව සම්භවය ආරම්භයේ සිටම අප අතර ජීවත් වන අතර විවිධ සමාජ සාධක නිසා තම අනන්‍යතාවය සඟවාගෙන නොයෙකුත් කැපකිරීම් කරමින් ජීවත් වෙති.

විවිධ සමාජභාවී අනන්‍යතා සහ ලිංගික දිශානතීන් ඇති ප්‍රජාව නීතිය ආරක්ෂා කිරීමේ මූලිකම ආයතනය වන පොලීසිය  වෙත හා අනෙකුත් රාජ්‍ය ආයතන වෙත පැමිණිලි රැගෙන පැමිණේ. සමාජ අපකීර්තිය, ලිංගික හිරිහැරවලට, රැකියා සඳහා බඳවා ගැනීම් වලදී වෙනස්කොට සැළකීම්වලට ලක් වීම සහ පවුලෙන් නෙරපා හැරීම් ආදියට මුහුණ

දෙමින් ජීවත් වේ. එවැනි අවස්ථාවන් වලදී ඔවුන්ගේ පැමිණිලි සඳහා ඔවුන්ගේ අනන්‍යතාවය හෝ ලිංගික දිශානතිය කුමක්ද යන්න නොසළකා නීතිය ක්‍රියාත්මක කරමින් යුක්තිය පසිඳලීම සහ සේවාවන් ලබා දීම බලාපොරොත්තු වේ.

විවිධ අනන්‍යතා ඇති ප්‍රජාව පැහැදිලිවම ප්‍රකාශ කරන්නේ නීතිය ක්‍රියාත්මක කරන නිළධාරීන්, සේවාවන් සපයන නිළධාරීන්, සමාජය සමග සෘජුව රාජකාරී කරන රාජ්‍ය නිළධාරීන් තම ගැටලු පිළිබඳ දැනුවත් කළ යුතු එක් කණ්ඩායමක් බවයි. පොලිස් නිළධාරීන්, නීතිය ක්‍රියාත්මක කරන නිළධාරීන් සහ අනෙකුත් සියලුම රාජ්‍ය නිළධාරීන්, සේවා සපයන ආයතන ලෙස සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන්ගේ සහ සමරිසි පුද්ගලයන්ගේ අනන්‍යතාවට ගරු කිරීම, ඔවුන්ගේ අනන්‍යතාවය මත වෙනස් කොට සැළකීම් නොකිරීම, පුද්ගලික ආරක්ෂාව සහ පුද්ගලිකත්වයට ඇති අයිතියට ගරු කිරීම, සිය රාජකාරි ඉටු කිරීමෙදී සහතික කිරීමේ වගකීම ඔවුනට ඇත. එසේම මෙම පුද්ගලයන්ට එරෙහිව අපරාධ ක්‍රියාවන් සිදු වුවහොත් ඔවුන් ආරක්ෂා කිරීමට පොලීසිය ක්‍රියාශීලීව මැදිහත් විය යුතු ය.

විවිධ අනන්‍යතා සහිත ප්‍රජාවේ වධහිංසා සහ කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැළකීම් හෝ දඬුවම් වලින් නිදහස් වීමේ අයිතිය තහවුරු කළ යුතුය. පැමිණිල්ලක් කිරීමට පැමිණි අවස්ථාවක, සේවාවන් ලබා ගැනීමට පැමිණි අවස්ථාවක අසමාන ලෙස සැළකීම, නොකරහැරීම, මගහැරීම, නොසැළකිල්ල, අනවශ්‍ය ලෙස ප්‍රමාද කිරීම,

පැමිණිලි හා සිදු වී ඇති අපරාධ හා වැරදි කෙරෙහි සංවේදී නොවීම නොකළ යුතුය.

රාජකාරී ස්ථාන වල ශාරීරික ප්‍රහාර, වාචික අපයෝජන, කුණුහරපයෙන් බැනවැදීම්, බ්ලැක්මේල් කිරීම, ලිංගික හිරිහැර කිරීම්, හෝ වෙනත් ආකාරවල ප්‍රචණ්ඩත්වයට පත් නොකළ යුතුය. මානසික වධහිංසා පැමිණවීම, අමානුෂික හෝ අවමන් සහගත ලෙස සැළකීම, දඬුවම් කිරීම නොකළ යුතුය.

නීතිය ඉදිරියේ පිළිගැනීමට ඇති අයිතිය තහවුරු කළ යුතුය. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12.1 වගන්තිය යටතේ සඳහන් **''නීතිය ඉදිරියෙහි සියල්ලෝම සමාන වන අතර නීතියේ රැකවරණය සර්ව සාධාරණ විය යුතුය''** යන ව්‍යවස්ථාමය සහතිය සළකා බැලීම සඳහා පොලිස් නිළධාරීන් LGBTIQ+ ප්‍රජාව සහ ඔවුන්ගේ අනන්‍යතාවල විවිධත්වය හඳුනාගත යුතුය. විවිධ අංශවල සිටින සියලුම පොලිස් නිළධාරීන් මානව ලිංගිකත්වයේ විවිධත්වය දැනුවත් විය යුතු අතර යෝග්‍යාකාර්තා මූලධර්මවල දක්වා ඇති ඔවුන්ගේ විශ්වීය වශයෙන් පිළිගත් අයිතිවාසිකම් සහ නිදහසට ගරු කළ යුතුය.

ශ්‍රී ලංකා රජය විසින් පුරවැසියන්ගේ පුද්ගලිකත්වයට ඇති අයිතිය තහවුරු කළ යුතුය. සමරිසි හා සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ගේ පුද්ගලික තොරතුරු රහසිගත තොරතුරු ලෙස සැළකිය යුතුය. පෞද්ගලික අනන්‍යතා සම්බන්ධයෙන් සවේදී තොරතුරු හෙළිදරව් කිරීම දැනගැනීමට අවශ්‍ය පදනමක් මත විය යුතු අතර ඔවුන්

අධිකරණයට ඉදිරිපත් කරන විට අනෙකුත් අත්අඩංගුවේ පසුවන්නන්ට, මහජනතාවට, නීතිඥයන්ට සහ අධිකරණ කාර්ය මණ්ඩලයට එම තොරතුරු හෙළි නොකළ යුතුය. සුබසාධන සේවා ලබා දීමේ දී අනන්‍යතාවය නොසළකා එම සේවාවන් සඳහා සම්බන්ධ කරගත යුතුය.

විවිධ අනන්‍යතා සහිත ප්‍රජාවගේ පවුල් ජීවිතය භුක්ති විඳීමට ඇති අයිතිය තහවුරු කළ යුතුය. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයකදී හෝ පවුලේ සාමාජිකයන් වෙනස්කොට සළකන විටදී පොලීසිය මෙම ප්‍රජාවේ කායික හා මානසික තත්ත්ව අවබෝධ කරගෙන ඒ අනුව ක්‍රියා කළ යුත්තේ එමගින් මෙම ප්‍රජාවට තම පවුලේ සාමාජිකයන් නිසා මුහුණ දීමට සිදුවන ගැටලු අවම කළහැකි බැවිනි. මෙම ප්‍රජාව මුහුණදෙන තීරණාත්මක තත්ත්වයන් පවුලේ සාමාජිකයන්ට අවබෝධ කර දීමට පොලිසිය මැදිහත් වී පියවර ගත යුතුය.

සමරිසි හෝ සංක්‍රාන්ති සමාජභාවී වීම මත පවුලෙන්, සහකරුවන්ගෙන් ඇතිවන ගැටලුකාරී අවස්තාවන් වලදී සමාජ සංස්තික චර්තාකම් වලට පමණක් සීමා නොවී අවුරුදු 18ට වැඩි වැඩිහිටියෙකුගේ උපරිම යහපත රටේ පවතින නීතියට අනුව නීත්‍යානුකූලව තහවුරු කිරීමට කටයුතු කළ යුතු වේ.

නීතිය බලාත්මක කිරීමේ අධිකාරීන් වෙත ප්‍රවේශ වීමේ අයිතිය තහවුරු කළ යුතුය. සමරිසි හෝ සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාව බියෙන් හෝ කිසිදු හිරිහැරයකින් තොරව ආත්ම විශ්වාසයෙන් පැමිණිලි කිරීමට පොලිසිය හෝ වෙනත් රාජ්‍ය ආයතාන ඉඩ ලබා දිය යුතු අතර, ඔවුන් පැමිණිලි

කරන විට ඒවා ප්‍රතික්ෂේප කිරීම හෝ වාචිකව අපයෝජනය කිරීම හෝ තර්ජනය කිරීම නොකළ යුතුය. ඊට අමතරව එම තොරතුරු අවභාවිතා නොකළ යුතුය.

## 07. LGBTIQ+ ප්‍රජාවට සහයෝගය දක්වන සහ විවිධත්වය අගය කරන ආයතන මොනවාද?

ශ්‍රී ලංකා පොලිසිය - ඉතිහාසයේ ප්‍රථම වතාවට ශ්‍රී ලංකා පොලිසිය විසින් පොලිස්පති චක්‍රලේඛ 2740/2022 නිකුත් කරමින් සමරිසි හා සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් මූලික කරගත් චක්‍රලේඛයක් නිකුත් කර තිබේ. නැවත එම චක්‍රලේඛය සංශෝධනය කරමින් එම චක්‍රලේඛයට සියලුම විවිධ අනන්‍යතා සහිත ප්‍රජාව ඇතුළත් කරමින් 2740/2022 (i) නිකුත් කර තිබේ. එමෙන්ම නැවත පොලිස්පති නිල කාර්යාලය මගින් මානව හිමිකම් කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ පිළිපදින ලෙස සියලුම පොලිස් නිළධාරීන් දැනුවත් කර නිවේදනයක් ද නිකුත් කරන ලදි.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය පද්ධතිය තුළ සෑම පුරවැසියෙකුටම සාධාරණ හා සමානාත්මතාවයෙන් යුතුව සෞඛ්‍යය සේවාවන් ලබා දීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කර තිබේ. විශේෂයෙන්ම LGBTIQ+ ප්‍රජාව සඳහා සෞඛ්‍ය සේවාවන් ලබා දීමට අවශ්‍ය ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සකස් කර මේ වන විට සාර්ථකව ක්‍රියාත්මක කරමින් පවතියි. 2026-2035 ජාතික සෞඛ්‍යය ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා LGBTIQ+ ප්‍රජාව සම්බන්ධයෙන් නීති සංශෝධන ඇතුලු වැදගත් ප්‍රතිපත්ති සකස් කරන ලදී.

සමාජ සේවා දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකාවේ සමාජ ගැටලු ආමන්ත්‍රණය කිරීමෙහි ලා ප්‍රමුඛතම දෙපාර්තමේන්තුවක් වන සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් LGBTIQ+ ප්‍රජාවේ සුබසාධනය, විවිධ අනන්‍යතා සහිත ප්‍රජාවට සේවාවන් වෙත ප්‍රවේශ වීමේ අයිතිය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය රාජ්‍ය නිළධාරීන් දැනුවත් කිරීමේ කටයුතු ආරම්භ කර තිබේ.

ශ්‍රී ලංකා මනෝ වෛද්‍යවරුන්ගේ විද්‍යාලය - සමරිසිභාවය හෝ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් මානසික රෝගීන් ලෙස වැරදි ලෙස අර්ථකතනය කිරීමට එරෙහිව ප්‍රසිද්ධ මාධ්‍ය නිවේදනයක් නිකුත් කරන ලදි.

ශ්‍රී ලංකා ප්‍රජා විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්‍යාලය LGBTIQ+ ප්‍රජාවට බලපාන නීති සංශෝධන කරන ලෙස බලධාරීන්ගෙන් ඉල්ලා සිටිමින් මාධ්‍ය නිවේදනයක් නිකුත් කර තිබේ.

ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන වැඩසටහන විසින් එම ආයතනයේ ජාතික ක්‍රමෝපායික සැළැස්ම සඳහා දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365අ වගන්ති වෙනස් කිරීම සඳහා අධිවාචනය කිරීම ඇතුළත් කර තිබේ.

ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය විසින් LGBTIQ+ ප්‍රජාවට අහිතකර ලෙස බලපාන නීති සංශෝධන කිරීම සඳහා, LGBTIQ+ ප්‍රජාවට සිදුවන කොන්කොට සැළකීම් සහ වෙනස්කොට සැළකීම් තුරන් කිරීම සඳහා ප්‍රතිපත්තිමය අංශයෙන් ජාතික මට්ටමේ අධිවාචන කටයුතු කරයි.

මානව හිමිකම් කොමිෂන් සභාව විසින් LGBTIQ+ ප්‍රජාවේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පොලිස් නිළධාරීන් හට මාර්ගෝපදේශ මාලාවක් නිකුත් කර තිබේ. එමෙන්ම, අධිකරණ අමාත්‍යාංශ වෙත දෙවතාවක් 365 සහ 365අ වගන්ති ඉවත් කරගන්නා ලෙස අධිකරණ අමාත්‍යවරුන් දෙදෙනෙකු හට නිර්දේශ නිකුත් කර තිබේ.

සියලුම රාජ්‍ය නිළධාරීන් රටේ මූලික නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීමට බැඳී ඇත. සියලුම පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සියලුදෙනාගේ වගකීමක් වන අතර රාජ්‍ය ආයතන සියල්ලක්ම විවිධත්වයට ගරු කරමින් නොපැකිළිව සේවාවන් ලබා දිය යුතුය.

# 08. <u>LGBTIQ+ ප්‍රජාවේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීමට දැනට පවතින නඩු තීන්දු ගැසට්, ප්‍රකාශන, නිර්දේශ සහ හෝ මාර්ගෝපදේශ මොනවාද?</u>

**<u>සංක්‍රාන්ති සමජභාවී පුද්ගලයන් සමඟ පොලිස් නිලධාරීන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ මාර්ගෝපදේශ (2022/23)</u>**

පසුගිය වසර තුළදී, සංක්‍රාන්ති සමජභාවී පුද්ගලයන්ට පොලිසිය අතින් සිදුවන හිරිහැරවලින් සහ වෙනස් කොට සැළකීම්වලින් ආරක්ෂා කිරීම අරමුණු කරගත් මාර්ගෝපදේශ දෙකක් ශ්‍රී ලංකා පොලිසියේ පොලිස්පතිවරයා විසින් නිකුත් කරන ලදී.

2022 දෙසැම්බර් මාසයේදී, පොලිස්පතිවරයා (IGP) විසින් රාජකාරි ඉටු කිරීමේදී සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් සමඟ මානුෂීයව සහ නීත්‍යානුකූලව කටයුතු කිරීම පිළිබඳ චක්‍රලේඛයක් පොලිස් නිලධාරීන් සඳහා නිකුත් කරන ලදී (IGP circular 2740/2022). 2023 මාර්තු මාසයේදී, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් එම අරමුණ සාක්ෂාත් කර ගැනීම අරමුණු කරගත් මාර්ගෝපදේශ මාලාවක් නිකුත් කරන ලද නමුත්, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ගේ මූලික අයිතීන් සහ ඔවුන් සම්බන්ධ රාජකාරි ඉටු කිරීමේදී පුරවැසියන් ආරක්ෂා කිරීමේ පොලිසියේ වගකීම කෙරෙහි වැඩි අවධාරනයක් ඇතිව මාර්ගෝපදේශ

නිකුත් කරන ලදී. (https://www.hrcsl .lk/hrcsl-launches-the-guidelines-for-police-officers-to-protect-transgender-person/).

මෙම වර්ධනයන් විවිධ පසුබිම් තුළ පුද්ගලයන්, රටේ LGBTIQ+ ප්‍රජාව සහ මානව හිමිකම් ක්‍රියාකාරීන් විසින් පිළිගනු ලැබූ අතර, මෙම මාර්ගෝපදේශ පිළිබඳ ජාතික මට්ටමේ කතිකාව ධනාත්මක එකක් විය. කෙසේ වෙතත්, මෙම මාර්ගෝපදේශ මාලාව සහ චක්‍රලේඛය කෙතරම් ප්‍රයෝජනවත් වේදැයි ක්‍රියාකාරීන් සහ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් සැක පහළ කරති, මන්ද අදට ද රාජ්‍ය නිළධාරීන් හරහා සිදුවන හිංසන යම් යම් ආකාරයට වාර්තා වන තත්ත්වයක් තිබේ. ඒ අතරම, නීතිය ක්‍රියාත්මක කරන පොලිස් නිලධාරීන් කෙතරම් උගත් සහ සමරිසි සහ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ට හිතකාමීද, සහ ඔවුන් මෙම ප්‍රතිපත්ති තීරණ කෙතරම් බැරෑරුම් ලෙස සලකනවාද යන්න පිළිබඳව කනස්සල්ලක් පවතී.

මෙම සන්දර්භය තුළ, ඉහත සඳහන් මාර්ගෝපදේශ ඵල දරන බව සහතික කිරීම සඳහා, විශේෂයෙන්ම සාමාන්‍ය පුරවැසියන් සමඟ ගනුදෙනු කරන පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ සහ සංවේදී කිරීමේ අවශ්‍යතාවය සමාජ ක්‍රියාකාරීන් සහ LGBTIQ+ පුද්ගලයින් පෙන්වා දී ඇත. ඒ අනුව 2024 වර්ෂයේ ඉක්විටි සංවිධානයේ තාක්ෂණික සහාය ඇතිව, ගරුත්වය, විවිධත්වය සහ පොලිසිය (Dignity, Diversity and Policing) යනුවෙන් පාඨමාලාවක් ද ශ්‍රී ලංකා පොලිස් අභ්‍යාස ආයතනයේ දැනට ක්‍රියාත්මක වෙමින් පවතියි.

2021 අගෝස්තු මාසයේදී, මහනුවර පොලිස් නිලධාරීන් සඳහා වූ පුහුණු වැඩසටහනකදී, සමරිසි භාවය ප්‍රතික්ෂේප කරන ලෙස පොලිස් නිලධාරීන් දිරිමත් කළ උපදේශකයෙකු සහ පුහුණුකරුවෙකුගේ වීඩියෝ පටයක් සමාජ මාධ්‍යවල ප්‍රචාරය විය. අමා දිසානායක ලෙසින් හඳුනාගෙන ඇති ඇය, තම දරුවන් “සමලිංගික පුද්ගලයන්ගේ වින්දිතයෙක්” වෙනවාට ඔබ කැමති දැයි පොලිස් නිලධාරීන්ගෙන් විමසූ අතර, ඊට “නැත” යනුවෙන් පොලිස් නිලධාරීන් ප්‍රතිචාර දැක්වූ අතර සමරිසිභාවය ප්‍රජනන ක්‍රියාවලියට දායක නොවන බව ඇය පෙන්වා දුන්නාය.

මෙය මෙරට LGBTIQ+ ප්‍රජාවට, විශේෂයෙන්ම සමරිසි පුරුෂ සහ සමරිසි කාන්තා පුද්ගලයින්ට වෙනස් කොට සැළකීම පිළිබඳ නව කතිකාවතක් නිර්මාණය වීමට හේතු විය. ඇයගේ සමස්ත කතාවේ සමරිසි අයිතිවාසිකම් පිළිනොගැනීම නිසා හා විවේචනය කිරීම නිසා LGBTIQ+ ක්‍රියාකාරීන් අමා දිසානායකට එරෙහිව දැඩි විරෝධයක් පළ කළ අතර නීතිමය ක්‍රියාමාර්ග පවා ගැනීමට උත්සාහ කළහ. ක්‍රියාකාරීන් පිරිසක් අභියාචනාධිකරණයට රිට් පෙත්සමක් ගොනු කළහ, LGBTIQ+ ප්‍රජාවට වෙනස් කොට සැලකීමේ අදහස් ප්‍රවර්ධනය කළ හැකි සැසි ඇතුළත් සම්මන්ත්‍රණ පැවැත්වීම වැළැක්වීම සඳහා පොලිසියට තහනම් නියෝගයක් නිකුත් කරන ලෙසයි. 2021 නොවැම්බර් 12 වැනි දින අභියාචනාධිකරණය පෙත්සම්කරුවන්ට හා වග උත්තරකරුවන්ට එනම් පොලිස්පති චන්දන ඩී වික්‍රමරත්න,

මහනුවර නියෝජ්‍ය පොලිස්පති (ඩීඅයිජී) චන්දන අලහකෝන් සහ දිසානායක යන අයට නොතීසි නිකුත් කිරීමට අවසර දුන්නේය.

<u>**සමරිසිභාවය පිළිබඳ ශ්‍රී ලංකා මනෝ වෛද්‍යවරුන්ගේ විද්‍යාලයේ ස්ථාවරය (2021)**</u>

අමා දිසානායකගේ ප්‍රකාශවලට එරෙහිව බොහෝ ක්‍රියාකාරීන් විරෝධය පළ කිරීමත් සමග, **ශ්‍රී ලංකා මනෝ වෛද්‍යවරුන්ගේ විද්‍යාලය**, 2021 අගෝස්තු මාසයේදී සමරිසි භාවය සම්බන්ධ මෙම වැරදි මතය සම්බන්ධයෙන් ප්‍රකාශයක් නිකුත් කළේය.

මනෝ වෛද්‍යවරුන්ගේ විද්‍යාලය සමරිසි බව මනසේ හෝ ශරීරයේ ඇතිවන රෝගයක් නිසා ඇතිවන තත්වයක්ය යන මතය අනුමත නොකරන බව අවධාරණය කරමින් එම ප්‍රකාශය මෙසේය: "නූතන මනෝ වෛද්‍යවරුන් සමරිසි බව මානසික රෝගයක් ලෙස නොසලකයි. සමරිසි භාවය මානසික රෝගයක් බවට ඇති මෙම මිත්‍යාව නූතන මනෝ විද්‍යාව අද අප විසින් පවත්වාගෙන යනු ලබන විද්‍යාත්මක සාක්ෂි මත පදනම් වීම සමග නොගැළපේ. නවීන වෛද්‍ය දැනුම සහ සමාජ වටිනාකම් අනුව, LGBTIQ ප්‍රජාවගේ ජීවන රටා තේරීම්වලට ගරු කළ යුතු අතර වෙනස් කොට සැලකීමක් නොකළ යුතුය.

සමරිසි බව සාපරාධී ක්‍රියාවක් බව සඳහන් දණ්ඩ නීති සංග්‍රහයේ 365 වගන්තිය වෙනස් කරන ලෙස බලධාරීන්ගෙන් දැඩි ලෙස ඉල්ලා සිටිමු.

මේ පෞරාණික නීතිය අහෝසි කර සමරිසි බව ශ්‍රී ලංකාව තුළ නිර්සාපරාධීකරණය කළ යුතුයි.''

**<u>සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් සඳහා සමාජභාවය හඳුනාගැනීමේ සහතිකය (GRC) හඳුන්වාදීම (2016)</u>**

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් වර්ෂ 2016 දී හඳුන්වා දෙන ලද GRC යනු සංක්‍රාන්ති ක්‍රියාවලිය අනුගමය කරන සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයකුට උපදේශක මනෝ වෛද්‍යවරයකු විසින් නිකුත් කළ හැකි ලියවිල්ලකි. සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් තම උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, විදේශ ගමන් බලපත්‍රය සහ රියදුරු බලපත්‍රය වැනි ඔවුන්ගේ නීත්‍යානුකූල ලියකියවිලි ඔවුන්ගේ සමාජභාවී අනන්‍යතාවයට ගැලපෙන පරිදි වෙනස් කිරීමට උත්සාහ කරන විට මෙය අවශ්‍ය වේ. රෙගුලාසි වලට අනුව, මෙය නිකුත් කළ යුත්තේ වයස අවුරුදු 16 ට වැඩි පුද්ගලයින්ට පමණක් වන අතර, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයකු අපේක්ෂිත සමාජභාවය (අනන්‍යතාවය) ඔවුන්ගේ උප්පැන්න සහතිකයේ පෙන්විය යුතුය.

මේ සම්බන්ධයෙන් චක්‍රලේඛයක් ද නිකුත් කර ඇතත්, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ගේ නීතිමය ලියකියවිලි වෙනස් කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන රාජ්‍ය නිලධාරීන්ගෙන් ප්‍රමාණවත් සහය සහ සේවා නොලැබෙන බවට ඇතැම් සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් මැසිවිලි නගති. කෙසේ වෙතත්, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් සැලකිය යුතු සංඛ්‍යාවක් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිගැනීම සඳහා වූ

සහතිකය GRC (Gender recognition certificate) ලබා ගැනීමෙන් පසු ඔවුන්ගේ නෛතික ලේඛන, විශේෂයෙන් උප්පැන්න සහතිකය, විදේශ ගමන් බලපත්‍රය සහ ජාතික හැඳුනුම්පත සාර්ථකව වෙනස් කර ඇත.

ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය හඳුන්වා දෙනු ලැබුවේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේදීය. ශ්‍රී ලංකාව (එවකට Ceylon) 1815 සිට 1948 දක්වා බ්‍රිතාන්‍ය යටත් විජිතයක් විය. මෙම කාලය තුළ, බ්‍රිතාන්‍ය පරිපාලනය යටත් විජිතය පුරා නීති ප්‍රමිතිකරණය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට උත්සාහ කළේය. අදටත් යම් යම් සංශෝධන සමග අප භාවිතා කරන්නේ යටත් විජිත සමයේ අපට ලැබුණු දණ්ඩ නීති සංග්‍රහයයි.

මෙම දණ්ඩ නීති සංග්‍රහයේ සමරිසි "ලිංගික සම්බන්ධතා" පිළිබඳ පමණක් නීතිමය තත්ත්වය තරමක් ප්‍රශ්නකාරී ලෙස පවතින්නේ දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365අ වගන්ති සමරිසි ලිංගික ක්‍රියාකාරකම් වල යෙදෙන අයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ඉඩ සලසන බැවිනි.

නමුත් මෙම වගන්ති වල ද ඍජුවම සමරිසි හෝ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ගේ ලිංගික ක්‍රියාකාරකම් පිළිබඳ සඳහන් නොකරයි. මෙම වගන්ති භාවිතා කොට සමරිසි පුද්ගලයන් අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීමට, අපකීර්තියට ලක් කිරීමට ඉඩ සළසයි.

## 365 වගන්තිය

"යම් පුරුෂයෙකු, ස්ත්‍රියක හෝ සතෙකු සමඟ ස්වභාවධර්මයට විරුද්ධව කැමැත්තෙන්ම කාමුක සංසර්ගයේ යෙදෙන ඕනෑම තැනැත්තෙකුට වසර දහයක් දක්වා දීර්ඝ කළ හැකි සිරගත කිරීමකින් දඬුවම් කළ යුතු අතර, දඩයකින් දඬුවම් කළ යුතුය වයස අවුරුදු දහසයට අඩු ඕනෑම පුද්ගලයකු සම්බන්ධයෙන් වයස අවුරුදු දහඅටට වැඩි තැනැත්තෙකු විසින් වරදක් කළ විට වසර දහයකට නොඅඩු සහ අවුරුදු විස්සක් නොඉක්මවන කාල සීමාවක් සඳහා බරපතළ සිරදඬුවමක් සහ දඩයක් නියම කළ යුතුය. එම පුද්ගලයාට සිදු වූ තුවාල සඳහා වරද සිදු කළ පුද්ගලයාට අධිකරණය විසින් තීරණය කරනු ලබන මුදලක් වන්දි ලෙස ගෙවීමට ද නියම කරනු ලැබේ."

## 365අ වගන්තිය

"ප්‍රසිද්ධියේ හෝ අප්‍රසිද්ධියේ හෝ වෙනත් තැනැත්තකු සමග යම් දැඩි අශිෂ්ට ක්‍රියාවක් සිදු කරන නැතහොත් එවැනි යම් ක්‍රියාවකට පාර්ශ්වකරුවකු වන හෝ, එබඳු යම් ක්‍රියාවක් යම් තැනැත්තකු විසින් කරනු ලැබීම කුට්ටනය කරන හෝ කුට්ටනය කිරීමට තැත් කරන කවර හෝ තැනැත්තකු වරදකට වරදකරු වන අතර, ඔහුට අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි කාලය කට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ ඒ බන්ධානාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකින්ම හෝ දඬුවම් කරනු ලැබිය යුතුය. තවද ඒ වරද වයස අවුරුදු දහ අටකට වැඩි තැනැත්තකු විසින් වයස

අවුරුදු 16 කට අඩු තැනැත්තකු සම්බන්ධයෙන් සිදු කරනු ලබන අවස්ථාවක, අවුරුදු දහයකට නො අඩු වූද අවුරුදු විස්සක් නො ඉක්මවන්නා වූද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකින් හා දඩයකින් ඒ තැනැත්තාට දඬුවම් කරනු ලැබිය යුතුය. තවද ඒ වරද සිදු කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාට සිදු කරන ලද හානි වෙනුවෙන් අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් ඒ තැනැත්තාට ගෙවන ලෙසද අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය."

**399 වගන්තිය:**

"යමකු වෙනත් තැනැත්තකු ලෙස බොරුවට හඟවමින් හෝ වෙනත් තැනැත්තකු වෙනුවට තවත් තැනැත්තකු දැනුවත් ව පෙනී පිටුවමින්, හෝ එකී තැනැත්තා හෝ වෙනත් තැනැත්තකු නියම වශයෙන්ම එකී තැනැත්තා හෝ වෙනත් තැනැත්තකු නොව, අන් තැනැත්තෙක් ය යි නිරූපනය කරමින් රටට තොත්, ඔහු " අනෙකකු ලෙස පෙනී සිටීමෙන් වචා කළ ලෙස " සලකනු ලැබේ."

දණ්ඩ නීති සංග්‍රහයේ 399 වගන්තිය මගින් 'වෙනත් පුද්ගලයකු ලෙස පෙනීසිටිමින් වංචා කිරීම' තහනම් කරයි, එයින් මූලික වශයෙන් අදහස් කරන්නේ වෙනත් කෙනෙකු ලෙස පෙනී සිටීම දඬුවම් ලැබිය හැකි වරදක් බවයි. LGBTIQ+ අයිතිවාසිකම් සංවිධාන සහ මානව හිමිකම් කොමිෂන් සභාවට, මානව හිජ්මිකම් ක්‍රියාකාරීන්ට ලැබෙන පැමිණිලි වලට අනුව මෙම නීතිය සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් ඉලක්ක කර

ඔවුන් වෙනත් පුද්ගලයන් ලෙස පෙනී සිටින බවට චෝදනා කිරීමට යොදා ගන්නා අතර, බොහෝ අවස්ථාවලදී පොලිසිය අතින් සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ට හිරිහැර සිදුවී ඇත. සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ට අනුව මෙම හිරිහැර හුදු වාචික අපයෝජනයේ සිට බරපතල ලිංගික සහ මුදල් අල්ලස් දක්වා විහිදේ.

1883 දී ලංකාව තුළ මෙම නීති සම්මත කළේ තම යටත්විජිතවල වික්ටෝරියානු සාරධර්ම ආරෝපනය කිරීමට පරිශ්‍රම දරමින් සිටි බ්‍රිතාන්‍යයන්ය. 1860 දී ඉන්දියානු නීති කොමිෂමේ සභාපති මැකොලේ සාමිවරයා ඉන්දියානු දණ්ඩ නීති සංග්‍රහයේ 377 වන වගන්තිය ඇතුළත් කළ යුතු යැයි නිර්දේශ කළේය. පසුව ශ්‍රී ලංකාව වැනි වෙනත් යටත්විජිතවල ද ඊට සමාන නීති බලාත්මක විය. මැකොලේ සාමිවරයාගේ මුල් කෙටුම්පත "අස්වාභාවික කාමයෙන් යුතුව කිසියම් පුද්ගලයෙකු ස්පර්ශ කරන ඕනෑම පුද්ගලයෙකුට දඬුවම් පැමිණවිය යුතු යැයි නියම කළේය". එවැනි දුරාචාරවත් ක්‍රියා සම්බන්ධව විවාදයක් කිරීමට මැකොලේ සාමිවරයා එරෙහි වූ බැවින් නීතිය සම්මත වූයේ එතරම් විවාදයකින් තොරවය. එම නිසා නීතියේ භාෂාව අපැහැදිලිය.

**සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කළ පොදු චක්‍රලේඛ අංක 01-34 / 2016 සංක්‍රාන්ති ලිංගික ප්‍රජාව සඳහා ස්ත්‍රී පුරුෂ භාවය පළිගැනීම සඳහා වූ සහතිකය නිකුත් කිරීම** - මෙම චක්‍රලේඛය හරහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන සියලුම සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ට රජයේ රෝහල් වල විශේෂඥ මනෝ

වෛද්‍යවරයා හරහා සහතිකය ලබා ගත හැකිය. එම සහතිකය ලබා ගත් පසු උප්පැන්න සහතිකයේ නම සහ නව සමාජභාවය (Gender), ජාතික හැඳුනුම්පත, විදේශ ගමන් බලපත්‍රය යනාදී සහතික වෙනස් කරගත හැකිය.

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව** විසින් සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් ආරක්ෂා කිරීම සඳහා පොලිස් නිළධාරීන් සඳහා වන මාර්ගෝපදේශය නිකුත් කිරීම. - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට LGBTIQ+ ප්‍රජාවගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි, පොලිස් වධ හිංසා පැමිණිලි හේතුවෙන් මෙම මාර්ගෝපදේශය ශ්‍රී ලංකා පොලිසිය වෙත නිකුත් කරන ලදී. මෙම මාර්ගෝපදේශයේ 12 වන මාර්ගෝපදේශය ශ්‍රී ලංකාවේ සියලුම LGBTIQ+ ප්‍රජාවේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමේ අයිතිය තහවුරු කරන ලෙස සහ ඒ සඳහා සාමකාමී පරිසරයක් තහවුරු කරන ලෙස ද ශ්‍රී ලංකා පොලිසියට දන්වා සිටියි.

මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2023.11.23 දින එවකට අධිකරණ හා බන්ධනාගාර කටයුතු පිළිබඳ අමාත්‍ය විජේදාස රාජපක්ෂ හට හා 2025.05.22 දින අධිකරණ අමාත්‍ය හර්ෂණ නානායක්කාර හට නිර්දේශයක් මගින් ප්‍රකාශ කළේ දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365අ වගන්ති සංශෝධනය සහ ඉවත් කිරීමට කටයුතු කරන ලෙසයි. (Press notice no - HRC/P/i/E/ 23/11/23)

**ශ්‍රී ලංකා පොලිසිය විසින් පොලිස්පති චක්‍රලේඛ 2740/2022, අපරාධ චක්‍රලේඛ 03/2022** හරහා සංක්‍රාන්ති ලිංගිකයන් සහ ලිංගික විපර්යාසයන්ට ලක් වූ තැනැත්තන් සම්බන්ධව කටයුතු කිරීමේදී සැළකිල්ලට ගත යුතු කරුණු යනුවෙන් මාර්ගෝපදේශ මාලාවක් ශ්‍රී ලංකා පොලිස් නිළධාරීන් සඳහා පනවන ලදී. මෙම චක්‍රලේඛයේ මාතෘකාව සම්බන්ධයෙන් ගැටළු සහගත තත්ත්වයක් ඇති වූ බැවින් ශ්‍රී ලංකා පොලිසිය විසින් ගරු නීතිපති තුමාගේ උපදෙස් මත පොලිස්පති චක්‍රලේඛ 2740/2022 (i) නිකුත් කරන ලදී. එම චක්‍රලේඛ සංශෝධනයේ සංක්‍රාන්ති ලිංගිකයන් සහ ලිංගික විපර්යාසයන්ට ලක් වූ තැනැත්තන් යන වචනය වෙනුවට LGBTIQ ප්‍රජාව යනුවෙන් භාවිතා කරන ලෙස දන්වා තිබේ.

**ශ්‍රී ලංකා පොලිසිය, පොලිස්පති නිල කාර්යාලය විසින් 2025.03.14 දින නැවතත් පොලිස්පති චක්‍රලේඛ 2740/2022** යන චක්‍රලේඛය හා මානව හිමිකම් කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ අනුව උපදෙස් මාලාවක් නිකුත් කළ අතර, සියලුම නිලධරයන් රාජකාරි කටයුතු වලදී එම උපදෙස් වලට අනුගතව කටයුතු කළ යුතු බව අවධාරණය කර ඇත.

**ශ්‍රී ලංකා මනෝ වෛද්‍යවරුන්ගේ විද්‍යාලය 2021.09.18 -** සමරිසි භාවය මනසේ සහ ශරීරයේ හටගන්නා අසනීපයක් නිසා හට ගන්නා බවට පවතින මතය ශ්‍රී ලංකා මනෝ වෛද්‍යවරුන්ගේ විද්‍යාලය අනුමත නොකරන බවට පැහැදිළිව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමු. නූතන යුගයේ මනෝ වෛද්‍යවරුන් සමරිසි භාවය මානසික අසනීපයක් ලෙස රෝග

විනිශ්චය කරන්නේ නැති අතර, එසේ සළකා ප්‍රතිකාර කරන්නේ ද නැත. සමරිසි භාවය මානසික අසනීපයක් ලෙස සළකන මෙම මිත්‍යා අදහස අපගේ සාමාජික වෛද්‍යවරුන් විසින් අනුගමනය කරන සාක්ෂි මත පදනම් වූ විද්‍යාව සමග ගැළපෙන්නේ නැත.

සමරිසි භාවය සාපරාධී වරදක් ලෙස දක්වා ඇති දණ්ඩ නීති සංග්‍රහයේ 365 වගන්තිය වෙනස් කරන ලෙස අධිකාරී ආයතන වලට බල කිරීමට අප කැමැත්තෙමු. මෙම යල් පැනගිය නීති අහෝසි කළ යුතු අතර සමරිසි භාවය සාපරාධී වරදක් ලෙස හැඳින්වීම අත්හිටවිය යුතුය යනුවෙන් ප්‍රසිද්ධ නිවේදනයක් ශ්‍රී ලංකා මනෝ වෛද්‍යවරුන්ගේ විද්‍යාලය නිකුත් කළේය.

**ශ්‍රී ලංකා ප්‍රජා විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්‍යාලය 2023.05.**08 දින ප්‍රසිද්ධ නිවේදනයක් මගින් දන්වා සිටින්නේ, සමරිසි ප්‍රජාව සාපරාධි ලෙස සළකන නීති වෙනස් (නිර්සාපරාධී) කිරීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන වැඩසටහනේ 2018-2022 උපාය මාර්ගික සැළැස්මේ සහ දැනට අවසන් 2023-2027 සැළැස්මේ ද LGBTIQ+ ප්‍රජාවට අහිතකර ලෙස බලපාන නීති වෙනස් කිරීමට කටයුතු කිරීමට ක්‍රියාකාරකම් ඇතුළත් ව ඇති බවයි.

නිර්සාපරාධීකරණය කිරීම මගින් සෞඛ්‍ය සේවාවන් සඳහා ප්‍රවේශය පුළුල් කිරීම, පරීක්ෂණ සහ ප්‍රතිකාර සඳහා මෙම ප්‍රජාවන් සම්බන්ධ කරගැනීම සහ සමාන සෞඛ්‍ය සේවාවන් ලබා දීම තුලින් ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවාව තුළ සමානාත්මතාවයේ සහ යුක්තියේ මුලධර්ම වලට

සහයෝගය දැක්විය හැකි බව ශ්‍රී ලංකා ප්‍රජා විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්‍යාලය නිවේදනය කර ඇත.

**විමලසිරි එදිරිව ස්ථානාධිපති (OIC), පොලිස් ස්ථානය, මරදාන, සහ නීතිපති (AG) (2016) යන නඩුවේ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව**

වර්ෂ 2016 දී, ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් ප්‍රකාශයට පත් කළේය (විමලසිරි එදිරිව OIC, පොලිස් ස්ථානය, මරදාන, සහ නීතිපති නඩුව) එහි 365A වගන්තියේ පැවැත්ම සහ බලාත්මක කිරීම පුළුල් ලෙස සාකච්ඡා කරන ලදී.

දණ්ඩ නීති සංග්‍රහයේ 365A වගන්තිය ප්‍රකාරව දැඩි අශෝභන ක්‍රියාවක් කළ බවට චෝදනා ලැබූ පුද්ගලයන් දෙදෙනෙකුට එරෙහිව පළමුව මහේස්ත්‍රාත් අධිකරණයේ මෙම නඩුව ගොනු කෙරිණි. මහේස්ත්‍රාත්වරයා ඔවුන් දෙදෙනා වැරදිකරුවන් බව හඳුනාගෙන ඔවුන්ට දඬුවම් නියම කළේය. ඔවුන් මහාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කළද මහාධිකරණය පෙර වරදකරු සහ දඬුවම ස්ථිර කළේය. ඉන් අනතුරුව ඔවුන් ශ්‍රේෂ්ඨාධිකරණයේ සහය ඉල්ලා සිටි අතර, මෙම නඩුව ජනාධිපති නීතිඥ ඊවා වනසුන්දර, ජනාධිපති නීතිඥ බුවනෙක අලුවිහාරේ සහ ජනාධිපති නීතිඥ අනිල් ගුණරත්න යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ල හමුවේ විභාගයට ගන්නා ලදී.

සිය තීන්දුවේ දී ශ්‍රේෂ්ඨාධිකරණය මෙසේ පැහැදිලි කළේය: "නඩුවට සම්බන්ධ පුද්ගලයින් වැඩිහිටියන් බවට ගැටළුවක් නැත සහ මෙම

ක්‍රියාව සම්මුතියකින් සිදුවූ බවට සැකයක් නැත. 365A වගන්තිය 19 වැනි සියවසේ දණ්ඩ නීති සංග්‍රහයේ ආරම්භයේ සිටම පාහේ අපගේ අපරාධ නීති විද්‍යාවේ කොටසක් විය. 1995 දී සුළු සංශෝධනයක් සිදු කරන ලද නමුත්, එහි ස්වභාවය වෙනස් නොකළ අතර වරද නොනැසී පවතී. මෙම වරද එංගලන්තයේ නීතියේ කොටසක් වූ සහ පොදු සදාචාරය මත පදනම් වූ ලිංගික හැසිරීම් සහ වැරදි සම්බන්ධයෙන් කටයුතු කරයි. ලිංගික අපරාධ පනත මගින් 2004 දී දැඩි අශෝභන සහ දඩබ්බර ලිංගික අපරාධ අවලංගු කරන ලද අතර දැන් එංගලන්තයේද එය වරදක් නොවේ.

තවද, වැඩිහිටියන් අතර එකගත්වයෙන් ඇති වන සංසර්ගය රාජ්‍යයේ පාලනයට යටත් නොකළ යුතුය යන සමකාලීන චින්තනය ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දුන්නේය. එසේම එකගත්වයෙන් ඇති වන සංසර්ගය අපරාධකරණයට හේතු නොවිය යුතුය යන සමකාලීන චින්තනය වසර ගණනාවක් තිස්සේ වර්ධනය වී ඇති බව පෙනෙන අතර එය වරදක් අවලංගු කිරීමට හේතු වූ තර්කය මෙය විය හැකි බව ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දුන් අතර එංගලන්තයේ මෙම නිතිය අවලංගු වීමට උක්ත කාරණයම බලපාන්නට ඇතැයි පෙන්වාදෙනු ලැබීය.

කෙසේ වෙතත්, එම වරද ශ්‍රී ලංකාවේ නීතියේ කොටසක් ලෙස පවතින බව වැඩිදුරටත් සඳහන් කළ විනිසුරු අලුවිහාරේ මහතා වැඩිදුරටත් මෙසේ පැවසීය. “*අභියාචකයාට පෙර වැරදි හෝ අපරාධ ඉතිහාසයක් ඇති බවට සාක්ෂි කිසිවක් නැත. එම නිසා එම ක්‍රියාව එකගත්වයෙන් සිදු*

*වූවක් වීම සහ අනෙක් විත්තිකරුගේ පැත්තෙන් ද අපරාධ ඉතිහාසයක් නොතිබීම යන කරුණු සැලකිල්ලට ගනිමින්, භාරකාර සිරදඬුවමක් සහිතව වරද දෙස බැලීමට යාම වරදට නොගැළපෙන බව පෙනේ. මගේ මතය අනුව, මෙය වැරදිකරුවන්ට තමන්වම නිවැරදි කරගැනීමට අවස්ථාවක් ලබා දීමට මෙම අවස්ථාව සුදුසුවේ. ඉහත කරුණු සලකා බැලීමේදී, නඩුවේදී සිරදඬුවම් නියම කිරීම සුදුසු නොවන බව මගේ අදහසයි."*

මෙම තත්ත්වය සැලකිල්ලට ගත් ශ්‍රේෂ්ඨාධිකරණය වසරක සිරදඬුවම අවලංගු කර එය වසර දෙකක බරපතළ සිරදඬුවමක් සමඟින් ආදේශ කළ අතර ඊට අමතරව අපරාධ නඩු විධාන සංග්‍රහයේ 303(1) වගන්තිය යටතේ ක්‍රියා කරනු ලැබීය. මහේස්ත්‍රාත්වරයා විසින් දඬුවම ප්‍රකාශ කළ දින සිට බලපැවැත්වෙන පරිදි වසර පහක කාලයක් සඳහා සිර දඬුවම් කාලය ක්‍රියාත්මක කිරීම අත්හිටුවන ලදී.

2020 ජුනි මාසයේදී නාරාහේන්පිට (කොළඹ) පොලිසිය විසින් පෞද්ගලික හෝටලයක් වටලා අත්අඩංගුවට ගත් සමරිසි පුරුෂයන් තිදෙනෙකුට එරෙහිව පවරා තිබූ නඩුවක් 2021 දෙසැම්බර් මාසයේදී කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත්වරයා විසින් නිෂ්ප්‍රභා කළේය. අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ කිසියම් ලිංගික ක්‍රියාකාරකමක යෙදී සිටි බව කියන සමරිසි ලිංගික හැසිරීම් සම්බන්ධයෙන් ඔවුන්ට චෝදනා එල්ල වී තිබේ. ඔවුන් අත්අඩංගුවට ගැනීමෙන් පසු පොලිස් වධ හිංසාවලට සහ අධිකරණ වෛද්‍ය නිලධාරීන් (JMOs) විසින් බලහත්කාරයෙන් ගුද

මාර්ග පරීක්ෂණවලට ලක් කර ඇත. අංක 34131/3/20 දරන නඩුව නිෂ්ප්‍රභා කිරීමට පදනම් වී ඇත්තේ නීතිපතිවරයා විසින් මෙම නඩුව විභාග නොකරන බවට පොලිසියට දන්වා තිබූ ලිපියක් පදනම් කරගෙනය.

# 09. රාජ්‍ය සේවයේ වගවීම සහ ජාත්‍යන්තර එකඟතාවයන්

පොලිසිය, රාජ්‍ය ආයතන සහ අයිතිවාසිකම්වලට අදාළ ගිවිසුම්, සම්මුති සහ මූල පිරීම්

2017 වර්ෂයේ නොවැම්බර් මස පැවති විශ්ව කාලාන්තර සමාලෝචන රැස්වීමේ දී, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිබිඹු වන සමානාත්මතාවයට සහ වෙනස් කොට සැලකීමට ඇති පොදු අයිතියට ලිංගික දිශානතිය පදනම් කොට ගත් වෙනස්කොට නොසැළකීම ව්‍යංගයෙන් ඇතුළත් කර ඇති බව සඳහන් කළ අතර, ඔවුන් එම අයිතිවාසිකම් ලබා දීමට අදහස් කරන බව ද ප්‍රකාශ කළේය. සමානත්වයට හා වෙනස්කොට නොසැලකීමට අදාළ සාමාන්‍ය අයිතිවාසිකම් පවතින ව්‍යවස්ථාවෙන් ආවරණය වන බව ප්‍රකාශ කළ අතර ලිංගික දිශානතිය මත පදනම්ව සිදුවන වෙනස්කොට සැලකීම් වැළැක්වීම සහතික කිරීම සඳහා ඉදිරියේදී සිදුකරන ව්‍යවස්ථා සංශෝධන යොදාගන්නා බව දක්වන ලදී. (A/HRC/37/17, ඡේදය 82).

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සමුලුවේ විශ්ව කාලාන්තර සමාලෝචනයෙහි 4 වන සමාලෝචන චක්‍රය 2023 පෙබරවාරි 1 වන දින පෙ.ව. 09.00 සිට ප.ව. 12.30 දක්වා (ජිනීවා වේලාවෙන්) ජිනීවාහි Palais des Nations හි කාමර අංක 20 හිදී පැවැත්විණි. එවකට විදේශ කටයුතු අමාත්‍ය අලි සබ්රි මහතා විසින් ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සමාලෝචන වාර්තාවෙන් පසුව, එක්සත් ජාතීන්ගේ

සාමාජික රටවල් ශ්‍රී ලංකාවට එහි මානව හිමිකම් තත්ත්වය පිළිබඳ නිර්දේශ ලබා දුන්හ.

නිර්දේශ අතර, බොහෝ රටවල් සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් කිරීම සහ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන්, විශේෂයෙන් ශ්‍රී ලංකාවේ ජීවත් වන LGBTIQ+ පුද්ගලයින් සම්බන්ධයෙන් අවධානය යොමු කළ බව දක්නට ලැබුණි.

UK (United Kingdom) – එක්සත් රාජධානිය, USA (United States of America) – ඇමරිකා එක්සත් ජනපදය, Uruguay – උරුගුවේ, Algeria – ඇල්ජීරියාව, Argentina – අර්ජන්ටිනාව, Australia – ඔස්ට්‍රේලියාව, Azerbaijan – අසර්බයිජානය, Brazil – බ්‍රසීලය, Burundi – බුරුන්ඩි, Canada – කැනඩාව, Chile – චිලී, Costa Rica – කොස්ටා රිකා, Cuba – කියුබා, Czechia – චෙක් ජනරජය, France – ප්‍රංශය, Georgia – ජෝර්ජියාව, Iceland – අයිස්ලන්තය, Israel – ඊශ්‍රායෙල්, Kuwait – කුවේට්, Latvia – ලැට්වියාව, Malta – මෝල්ටාව, Mexico – මෙක්සිකෝ, Netherlands – නෙදර්ලන්තය, New Zealand – නව සීලන්තය, Norway – නෝර්වේ, Hungary – හංගේරියාව වැනි රටවල් සමරිසි හැසිරීම් අපරාධයක් ලෙස සැළකිය හැකි දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365A අවලංගු කරන ලෙස රජයෙන් ඉල්ලා සිටියේය.

වධහිංසාවට එරෙහි සම්මුතියට අනුකූලව සහ සෞඛ්‍ය සේවා සහ ඖෂධ, අනෙකුත් සමාජ සේවා සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා ආයතන වෙත ප්‍රවේශ වීමේදී සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන්

කිරීම සඳහා පියවර ගනිමින් LGBTIQ+ පුද්ගලයින් සඳහා පරිවර්තන ප්‍රතිකාර තහනම් කිරීමට ද එම රටවල් වලින් ශ්‍රී ලංකා රජයට නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ ප්‍රධාන පදනම වන්නේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (UDHR), සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR) සහ ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICESCR) යි. ඒවායේ එකතුව ජාත්‍යන්තර අයිතිවාසිකම් පිලිබඳ පනත් කෙටුම්පත සාදයි . මෙම නීති ගෝලීය වශයෙන් සහ කලාපීය වශයෙන් ජාත්‍යන්තර ගිවිසුම් සහ ප්‍රකාශන 80 කට අධික ප්‍රමාණයකට ආභාෂය ලබා දී ඇති අතර, මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම සඳහා නීත්‍යානුකූලව බැඳී ඇති පද්ධතියකි.

# 10. ජාත්‍යන්තර සම්මුතීන් සහ ගිවිසුම්

- මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (1948)
- සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (1976)
- කාන්තාවන්ට එරෙහිව වෙනස්කොට සැලකීම තුරන් කිරීම පිළිබඳ සම්මුතිය (1979)
- ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICESCR)
- වධහිංසා සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම් හෝ දඬුවම්වලට එරෙහි සම්මුතිය (CAT)
- ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට සහ වෙනස්කොට සැලකීමට එරෙහිව ආරක්ෂා කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාව, 2016 ජුනි 30
- මානව හිමිකම්, ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාව, 2014 සැප්තැම්බර් 26
- 1995 බීජිං ප්‍රකාශනය සහ පියවර ගැනීම සඳහා වූ වේදිකාව

ආසියානු ගිවිසුම් සහ සම්මුතීන්

- කලාපීය සහයෝගීතාව සඳහා වන දකුණු ආසියානු සංගමයේ (SAARC) සමාජ ප්‍රඥප්තිය (2004)

*''ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් ඇති* ***මූලික අයිතිවාසිකම්*** *යනු සමානත්වය, අදහස් ප්‍රකාශනයේ නිදහස, ආගමික නිදහස, පුද්ගල නිදහස, නීතිය ඉදිරියේ සමාන ආරක්ෂාව වැනි මිනිසාගේ ගෞරවය සහ නිදහස රැකගන්නා අත්‍යවශ්‍ය අයිතිවාසිකම් වේ. මේවා ආරක්ෂා කිරීම වැදගත් වන්නේ බලය අයුතු ලෙස භාවිතා වීම වැළැක්වීමටත්, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමටත්, සියලු පුරවැසියන්ට භේදයකින් තොරව සාධාරණත්වය සහ ආරක්ෂාව ලබාදීමටත්ය. මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ප්‍රධාන වගකීම රාජ්‍යයට අයත් වන අතර, විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය යන සියලු රාජ්‍ය ආයතන ඒවා ගරු කර ක්‍රියා කළ යුතුය. විශේෂයෙන්ම* ***අධිකරණය*** *මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ අවස්ථාවලදී ඒවා ආරක්ෂා කිරීමටත් සාධාරණ ප්‍රතිකාර ලබාදීමටත් වගකීම් දරයි. එසේම රාජ්‍ය නිලධාරීන්, පොලිසිය, සන්නද්ධ හමුදා සහ අනෙකුත් බලධාරීන් සියලු දෙනාම මූලික අයිතිවාසිකම් ගරු කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා වගකිව යුතු අතර, පුරවැසියන් ද තම අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් වී ඒවා රැකගැනීමට සක්‍රීය විය යුතුය.''*

මෑත වසරවලදී, විවිධ අනන්‍යතා සහිත ප්‍රජාව සහ ඔවුන්ගේ අයිතිවාසිකම් ශ්‍රී ලංකාව තුළ පිළිගැනීමට සහ කතාබහට ලක්ව ඇත. එහෙත්, මෙම වර්ධනය වන සංවාදය තුළ, LGBTIQ+ පුද්ගලයින්ගේ අවශ්‍යතා, අත්දැකීම් බොහෝ විට නොසලකා හැර, කොන් කර හෝ වරදවා වටහාගෙන ඇත. LGBTIQ+ ප්‍රජාවේ බොහෝ දෙනෙකුට ඇති අභියෝග හුදෙක් අයිතිවාසිකම් මූලික වූ ගැටලු නොවේ - ඒවා පද්ධතිමය අපකීර්තිය, වෙනස්කම් කිරීම, අපරාධකරණය සහ සමාජ බැහැර කිරීම සමඟ ගැඹුරින් බැඳී ඇත. මෙම අභියෝගවලට මුහුණ දීම සඳහා අනුකම්පාව පමණක් නොව, යුක්තිය, සමානාත්මතාවය සහ ගෞරවය සඳහා සියලුම පුරවැසියන්ගේ නිර්භීත කැපවීමක් අවශ්‍ය වේ.

ශ්‍රී ලංකාවේ විවිධ අනන්‍යතා සහිත ප්‍රජාවේ අයිතිවාසිකම් පිළිබඳ මෙම කෘතිය රාජ්‍ය සේවය සහ මානව හිමිකම් අතර පරතරය පියවීමේ වැදගත් පියවරක් නියෝජනය කරයි. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, චක්‍රලේඛ, මාර්ගෝපදේශ, නිල නිවේදන, ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දු හරහා රචනා කරන ලද මෙම කෘතිය, ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ සමාජභාවී විවිධත්වය, සහ ඔවුන්ගේ ඔරොත්තු දීමේ හැකියාව විස්තර කරයි, ඒ සමඟම අයිතිවාසිකම් තහවුරු කිරීම, ගෞරවනීය සහ අයිතිවාසිකම් මත පදනම් වූ සේවාවක් සඳහා ප්‍රවේශයක් ඉදිරිපත් කරයි.

ශ්‍රී ලංකාව මානව සංවර්ධනයේ හැරවුම් ලක්ෂයක සිටී. ආන්තික ප්‍රජාවන්ගේ හඬ වැඩිවන දෘශ්‍යතාව, අයිතිවාසිකම් සහ නීතිය පිළිබඳ

දිනෙන් දින වැඩෙන දැනුවත්භාවය සමඟ එක්ව, සේවාවන් සහ රැකවරණය ලබා දීම පුණ්‍ය කර්මයක් හෝ නිවැරදි කිරීමක් ලෙස නොව, බලගැන්වීම සහ විමුක්තිය ලෙස නැවත සිතීමට බලවත් අවස්ථාවක් නිර්මාණය කරයි.

මෙම මාර්ගෝපදේශය හුදෙක් දැනුවත් කිරීම අරමුණු නොකරයි. එය අපේ රටේ පවතින පද්ධති, ආයතන සහ ආකල්ප පරිවර්තනය කිරීමට උත්සාහ කරයි. ආන්තීකරණයට ලක් වන ප්‍රජාවේ ජීවිතවලට හානි කරන තත්වයන් ආරක්ෂා කිරීමේදී හෝ ප්‍රජාවන්ට අභියෝග කිරීමේදී ඔවුන්ගේ භූමිකාවන් නැවත පරීක්ෂා කිරීමට රාජ්‍ය නිළධාරීන්, වෘත්තිකයන්, ප්‍රතිපත්ති සම්පාදකයින්, අධ්‍යාපනඥයින් සහ ප්‍රජා සහචරයින්ට මෙම මාර්ගෝපදේශය අත්වැලක් සපයයි.

මෙම කෘතිය අනෙකාට සංවේදනයෙන් සවන් දීමට, අඛණ්ඩතාවයෙන් ක්‍රියා කිරීමට සහ සෑම පුද්ගලයෙකුගේම ලිංගික දිශානතිය, සමාජභාවී අනන්‍යතාවය හෝ ප්‍රකාශනය නොසලකා ඔවුන්ගේ ආවේණික වටිනාකම ආරක්ෂා කිරීමට, අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට කරන සිහි කැඳවීමක් ද වේ. සැබෑ නිදහස් රාජ්‍ය සේවය සියලුම පුරවැසියන්ට සමානව නොමැතිව පැවතිය නොහැකි අතර, සාධාරණත්වය නොමැතිව නිදහස අසම්පූර්ණ වේ.

මෙම මාර්ගෝපදේශය වෙනසක් සඳහා මෙවලමක්, සහයෝගය සඳහා සම්පතක් සහ රාජ්‍ය සේවයෙන් කිසිවෙකු මගහැරී ඉතිරි

නොවන බව සහතික කිරීම සඳහා අපගේ සාමූහික වගකීමට සාක්ෂියක් වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

මෙම කෘතියෙන් සාකච්ඡා කර ඇති කරුණු සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු සඳහා පහත වෙබ් අඩවිය පරීක්ෂා කරන්න.

**ගෞරවය, සමානාත්මතාවය සහ පාලනය**

ශ්‍රී ලංකාවේ LGBTIQ+ ප්‍රජාවේ අයිතිවාසිකම් අවබෝධ
කර ගැනීම සහ සහාය දීම සඳහා මාර්ගෝපදේශයක්

Dignity, Diversity, and Governance

සම්පාදනය
H.K.M.තුෂාර මනෝජ්
N.B. ආදිල් සුරාජ් විමුක්ති

ISBN: 9 7-8-6244 -888-0
9 786244 888000

පිටකවර නිර්මාණය - N.B. ආදිල් සුරාජ් විමුක්ති

Equité ආයතනයේ ප්‍රකාශනයකි

Equité HUMANITY for ALL